# ආර්ථික හා සමාජ පිරිවැය

## බලශක්තිය

1994 වසරේදී බලශක්ති අංශයෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ වාණිජ බලශක්ති භාවිතයේ සීඝ්‍ර වර්ධනයයි. වර්ෂය තුළදී විදුලිබල ගාස්තු සැළකිය යුතු ලෙස ඉහළ ගියද විදුලිබලය සඳහා ඉල්ලුම සියයට 10 කට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය විය. සැපයුම් අංශයෙන් බලන කළ ජල විදුලිබල සම්පාදනය මගින් මෙම ඉල්ලුමෙන් සැළකිය යුතු ප්‍රමාණයක් සැපයීමට ලංකා විදුලි බල මණ්ඩලය (ලං. වි. ම) සමත් විය. විදුලි බලය සඳහා වූ ඉල්ලුමේ අඛණ්ඩ වර්ධනයත් ඒ හා එක්වුණු අහිතකර කාලගුණික තත්ත්වයන් නිසාත් වසරේ තෙවන කාර්තුවේදී තාප බල උත්පාදනය ඉහළ නැංවීමට අවශ්‍යය විය. මේ අතර, සුදු ඩීසල්, බැර ඩීසල්, පෙට්රල් සහ භූමිතෙල් භාවිතය ඉහළ යාම හේතුවෙන් ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම 1994 දී සැළකිය යුතු ලෙස වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ පරිභෝජනය ඉහළ යාම නිසා ඛණිජ තෙල් සඳහා දැරීමට සිදුවූ පිරිවැයෙහි අහිතකර බලපෑම, ලෝක වෙළෙඳ පොළෙහි බොර තෙල් සඳහා වර්ෂය තුළ පැවති පහළ මිළ මට්ටම මගින් බොහෝදුරට සමනය කෙරුණි. 1994 වර්ෂයේදී බලශක්ති අංශයේ දක්නට ලැබුණු මෙම වර්ධනයන් කෙටිකාලීන වශයෙන් ස්ථිර ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ දිගු කාලීන වශයෙන් සැපයුම සැලසුම් ගතව පුළුල් කිරීමේ ක්‍රියාදමයක දැඩි අවශ්‍යතාවය අවධාරණය කරයි.

ඉල්ලුමෙහි සැළකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරමින් මුළු බලශක්ති පරිභෝජනයෙන් වාණිජ බලශක්ති ප්‍රමාණය (ඛණිජ තෙල්, විදුලිබලය සහ ද්‍රවීකරණය කරන ලද ඛණිජ තෙල් වායු) 1993 දී සියයට 32 සිට 1994 දී සියයට 34 දක්වා ඉහළ ගියේය. දර, කෘෂිකාර්මික අප ද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය සහ වෙනත් ශාඛ අපද්‍රව්‍ය වලින් සමන්විත වාණිජ නොවන බලශක්ති මූලාශ්‍රයන් ප්‍රධානතම බලශක්ති මූලාශ්‍රය වශයෙන් තවදුරටත් පැවතුන අතර, එය ඛණිජ තෙල් සමක (ඛ. ටො. ස) දශලක්ෂ 5.0 ක් එනම් දිවයිනේ මුළු බලශක්ති සැපයුමෙන් (ඛ.ටො.ස. දශලක්ෂ 7.6) සියයට 66 ක් විය.

## විදුලිය බලය

ජල විදුලිබල ධාරිතාවය මෙගවොට් 1,137 ක් සහ තාපබල ධාරිතාවය මෙගවොට් 272 කින් සමන්විත මෙගවොට් 1,409 ක් වූ 1994 විදුලිය බලය මුළු ස්ථාපිත ධාරිතාවය 1992 වසරේ සිට නොවෙනස්ව පැවතිනි. කෙසේවුවද, 1994 වර්ෂය තුළ ලං. වි. ම. විසින් උත්පාදනය කළ මුළු විදුලිය බල ප්‍රමාණය 1993 දී ගිගවොට් පැය 3,979 සිට 1994 දී ගිගවොට් පැය 4364 ක් දක්වා වැඩි විය. මෙය සියයට 10 ක වර්ධනයක් වන අතර, පසුගිය වසරේ ඒ හා සැසඳෙන වර්ධනය සියයට 12 ක් විය. 1994 වසරේ ප්‍රථම භාගය තුළදී ජල විදුලිබල උත්පාදනය සියයට 21 ක සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. එසේ වුවද විදුලි බලාගාර ආශ්‍රිත ජලාශවල ජල මට්ටම පහත බැසීම හේතුවෙන් තුන්වන කාර්තුවේදි ජල විදුලිබල උත්පාදනය අඩුවීම නිසා 1994 වසරේ ජල විදුලිබල උත්පාදනයේ සමස්ත වර්ධනය සියයට 8 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විමසුමට ලක්වන කාලච්ඡේදයේදී වැඩිමනත් ඉල්ලුම සපුරාලීමට තාපබල උත්පාදනය සියයට 50 කින් ගිහවොට් පැය 275 දක්වා ඉහළ නැංවිය. මෙම හේතුන් නිසා විදුලිබල උත්පාදනය සඳහා වූ ඉන්ධන පිරිවැය 1993 වසරේදී රුපියල් දශලක්ෂ 347 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 801 දක්වා ඉහළ ගියේය. මේ අතර විදුලිබල උත්පාදනය සම්ප්‍රේෂණය සහ බෙදහැරීමේ ක්‍රියාවලියේදී දැරීමට සිදුවූ පාඩුව 1993 දී සියයට 17.6 ක සිට 1994 දී සියයට 17.8 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. විදුලි බලය සම්ප්‍රේෂණයේදී සහ බෙදහැරීමේදී සිදුවන පාඩු අඩු කර ගැනීම සඳහා ලං. වි. ම. විසින් දබෙදහැරීම ව්‍යාප්ත කිරීම සහ පුනරුත්ථාපන ව්‍යාපෘතිය නමින් ප්‍රධාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව පළාත් පාලන ආයතනවල බෙදහැරීමේ ක්‍රමය පුනරුත්ථාපනය කිරීම සඳහා (පළාත් පාලන අධිකාර පවරාගැනීම් I සහ II) තවත් ව්‍යාපෘති දෙකක් දියත් කරනු ලැබීන.

1994 වර්ෂය තුළදී ලං. වි. ම. විසින් දෙවතාවක් විදුලිබල ගාස්තු ප්‍රතිශෝධනය කරන ලදි. පෙබරවාරි මාසයේදි ගෘහස්ථ අංශයේ විදුලිබල ගාස්තු, පරිභෝජන මට්ටම මත පදනම් වි

1.29 සංඛ්‍යා සටහන

## බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1993 - 1994

| ශීර්ෂය | ඒකක | 1993 | 1992ට වඩා ප්‍රතිශත වෙනස | 1994* | 1993ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛණිජ තෙල් නිෂ්පාදන | | | | | |
| 1.1 අපනයන කළ ප්‍රමාණය | මෙ.ටො. | 589.929 | 46.0 | 611,791 | 3.7 |
| 1.2 අපනයන වටිනාකම | රු.ද.ල. | 3801.0 | 37.2 | 3958.9 | 4.2 |
| | වි.ගැ.හි.ද.ල. | 56.5 | 25.6 | 56.0 | -0.9 |
| 1.3 ආනයන කළ ප්‍රමාණය | | | | | |
| 1.3.1 බොර තෙල් | මෙ. ටො. | 1,799,597 | 38.8 | 1,897,629 | 5.4 |
| 1.3.2 පිරිපහදු නිෂ්පාදන | ” | 294,090 | -55.5 | 288,328 | -2.0 |
| 1.3.3 එල්. පි. ගෑස් | ” | 37.560 | 19.7 | 50,193 | 33.6 |
| 1.4 ආනයන වටිනාකම (මි.ස.ගැ) | | | | | |
| 1.4.1 බොර තෙල් | රු.ද.ල. | 11,222.37 | 46.4 | 11,407.45 | 1.6 |
| | වි.ගැ.හි.ද.ල | 166.53 | 34.1 | 161.24 | -3.2 |
| 1.4.2 පිරිපහදු නිෂ්පාදන | රු.ද.ල. | 2,553.63 | -53.8 | 2,446.36 | -4.2 |
| | වි.ගැ.හි.ද.ල. | 37.89 | -57.7 | 34.58 | -8.7 |
| 1.4.3 එල්. පී. ගෑස් | රු.ද.ල. | 545.00 | 10.0 | 704.00 | 29.2 |
| | වි.ගැ.හි.ද.ල. | 8.09 | 0.9 | 9.95 | 23.0 |
| 1.5 බොර තෙල් බැරලයක සාමාන්‍ය මිළ (මි. ස. ගැ.) | රුපියල් | 842.71 | 4.9 | 806.11 | -4.3 |
| | එ.ජ.ඩොලර් | 17.47 | -4.6 | 16.31 | -6.6 |
| 1.6 දේශීය අලෙවිය | මෙ. ටො. | 1,417,712 | -4.6 | 1,567,918 | 10.6 |
| 1.6.1 පෙට්රල් | ” | 172,812 | 4.8 | 183,680 | 6.3 |
| 1.6.2 සුදු ඩීසල් | ” | 666,513 | 9.9 | 727,923 | 9.2 |
| 1.6.3 බැර ඩීසල් | ” | 18.020 | -85.6 | 53,902 | 199.1 |
| 1.6.4 සුපිරි ඩීසල් | ” | 23,216 | 2.2 | 24,274 | 4.6 |
| 1.6.5 භූමිතෙල් | ” | 191,629 | 1.2 | 206,929 | 8.0 |
| 1.6.6 දැවි තෙල් | ” | 219,918 | -12.6 | 228,345 | 3.8 |
| 1.6.7 ගුවන් යානා ඉන්ධන | ” | 72,563 | -11.0 | 78,443 | 8.1 |
| 1.6.8 ගුවන් යානා ගැසොලින් | ” | 164 | -12.8 | 165 | 0.6 |
| 1.6.9 එල්. පි. ගෑස් | ” | 52,877 | 18.3 | 64,257 | 21.5 |
| 1.7 දේශීය මිළ | රු /,, ලීටර | | | | |
| 1.7.1 පෙට්රල් | | 35.00 | 6.1 | 35.00 | 0 |
| 1.7.2 සුදු ඩීසල් | ” | 12.20 | 4.7 | 11.40 | -6.6 |
| 1.7.3 බැර ඩීසල් | ” | 11.60 | 4.0 | 10.70 | -7.8 |
| 1.7.4 සුපිරි ඩීසල් | ” | 15.00 | 3.1 | 14.20 | -5.3 |
| 1.7.5 භූමිතෙල් | ” | 11.80 | 34.1 | 9.50 | -19.5 |
| 1.7.6 දැවි තෙල් | | | | | |
| 500 | ” | 7.10 | 0 | 7.10 | 0 |
| 800 | ” | 6.80 | 0 | 6.80 | 0 |
| 1000 | ” | 6.50 | 0 | 6.50 | 0 |
| 1.7.7 තාර | ” | 15.15 | 0 | 15.15 | 0 |
| 1.7.8 එල්. පි. ගෑස් | රු/කි.ග්‍රෑ. | 20.00 | 20.9 | 19.23 | -3.9 |
| 2. විදුලිය බලය | | | | | |
| 2.1 ස්ථාපිත ධාරිතාව | මෙගවොට් | 1409.65 | 0 | 1409.65 | 0 |
| 2.1.1 ජල බලය | ” | 1137.45 | 0 | 1137.45 | 0 |
| 2.1.2 තාප බලය | ” | 272.20 | 0 | 272.20 | 0 |
| 2.2 ජනනය කළ ඒකක | ගිග.වොට්.පැ. | 3979.0 | 12.4 | 4364.0 | 9.7 |
| 2.2.1 ජල බලය | ” | 3796.0 | 30.9 | 4089,0 | 7.7 |
| 2.2.2 තාප බලය | ” | 183.0 | -71.4 | 275.0 | 50.3 |
| 2.3 මුළු අලෙවිය | ගිග.වොට්.පැ. | 3270.1 | 12.1 | 3582.0 | 9.5 |
| 2.3.1 ගෘහස්ථ | ” | 826.0 | 17.3 | 933.0 | 13.0 |
| 2.3.2 කාර්මික ** | ” | 1223.4 | 15.7 | 1404.0 | 14.8 |
| 2.3.3 වාණිජ | ” | 641.1 | 10.4 | 593.0 | -7.5 |
| 2.3.4 පළාත් පාලන ආයතන | ” | 536.4 | -1.5 | 612.0 | 14.1 |
| 2.3.5 වීදි ආලෝක කිරීම | ” | 43.2 | 50.0 | 40.0 | -7.4 |

* තාවකාලික.

** 1994 පෙබරවාරි මස සිට හෝටල් වලට කරන ලද විදුලිය අලෙවිය ද ඇතුලත් වේ.

මූලයන් : ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
ලංකා විදුලිබල මණ්ඩලය,
සී/ස කොළඹ ගෑස් සමාගම සහ
ලංකා මෙරයින් සර්විසස්(පෞද්ගලික) සමාග.ම

1.30 සංඛ්‍යා සටහන

## සංශෝධිත විදුලි ගාස්තු

| කාණ්ඩය | 93.07.01 දින සිට | | 94.02.01 දින සිට | | 94.05.01 දින සිට |
|---|---|---|---|---|---|
| | (කි.වො.පැ/රු.) | සංශෝධිත කාණ්ඩය | සංශෝධිත ගාස්තු (කි.වො.පැ/රු.) | සංශෝධිත කාණ්ඩය | සංශෝධිත ගාස්තු (කි.වො.පැ/රු.) |
| 1. ගෘහස්ථ කාර්‍යයන් | | | | | |
| ඒකක 0-10 | 0.60 | | | 0-10 | 0.60 |
| 11-50 | 1.20 | 0-60 | 1.70 | 11-50 | 1.20 |
| 51-100 | 2.40 | | | 51-100 | 2.40 |
| 101-450 | 3.90 | 61-180 | 4.40 | 101.180 | 4.40 |
| >450 | 5.20 | >180 | 5.25 | >180 | 5.25 |
| 2. කාර්මික කටයුතු | | | | | |
| කුඩා | 3.05 | | 4.00 | | 4.00 |
| මධ්‍යම | 2.90 | | 3.80 | | 3.80 |
| විශාල | 2.80 | | 3.65 | | 3.65 |
| 3. පොදු කාර්‍යයන් | | | | | |
| කුඩා | 4.05 | | 5.30 | | 5.30 |
| මධ්‍යම | 4.00 | | 5.20 | | 5.20 |
| විශාල | 3.85 | | 5.00 | | 5.00 |
| 4. හෝටල් * | | | | | |
| කුඩා | 4.05 | | - | | - |
| මධ්‍යම | 4.00 | | - | | - |
| විශාල | 3.85 | | - | | - |

සටහන.

කුඩා : වෝල්ත 400/230 බලයකින් සපයන්නාවූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ත ඇම්පියර් 50 ට අඩු.

මධ්‍යම : වෝල්ත 400/230 බලයකින් සපයන්නාවූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ත ඇම්පියර් 50 ට හෝ 50 ට වැඩි.

විශාල : දහසු වෝල්ත 11, දහසු වෝල්ත 33 සහ දහසු වෝල්ත 132 බලයකින් විදුලිය සැපයිම

දවසේ වේලාව අනුව ගාස්තු අදළ වන්නේ කාර්මික සහ හෝටල් අංශ වලට පමණි. විදුලි බලය අධික ඉල්ලුමක් ඇති අවස්ථාවල සහ අනිකුත් වේලාවන් සඳහා ගාස්තු සියයට 30 - 31 දක්වා ඉහළ නංවන ලදි.

* 1994 පෙබරවාරි මස සිට කාර්මික අංශයටඅයත් ගාස්තු අදළ වේ.

මූලය : ලංකා විදුලිබල මණ්ඩලය.

සියයට 1 ත්, සියයට 183 ත් අතර පරාසයකින් ඉහළ දමන ලදී. අනෙකුත් අංශයන්හි විදුලිබල ගාස්තු සියයට 30 කින් ඉහළ දමන ලදී. කෙසේ වුවද 1994 මැයි මාසයේදී ගෘහස්ථ අංශයෙහි පළමු ඒකක 100 සඳහා වූ විදුලිබල ගාස්තු 1993 ජුලි මාසයේ පැවති මට්ටම දක්වා සියයට 29 ත්, සියයට 65 ත් අතර ප්‍රමාණයකින් පහත හෙළන ලදී. මෙම විදුලිබල ගාස්තු ප්‍රතිශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස විදුලි ඒකකයක් සඳහා සාමාන්‍ය ගාස්තුව 1993 දී රුපියල් 2.64 සිට 1994 දී රුපියල් 3.68 දක්වා සියයට 39 කින් ඉහළ ගියේය. ප්‍රතිශෝධිත විදුලිය ගාස්තු සමඟ පෙර පැවති විදුලිය ගාස්තු සංඛ්‍යා සටහන් 1.30 මගින් දැක්වේ.

විදුලිබල ගාස්තු සැළකිය යුතු ලෙස ඉහළ නැංවුවද 1994 දී ලං. වි. ම. මගින් කරණු ලැබූ විදුලිය අලෙවිය සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කරමින් ගිගවොට් පැය 3582 ක් විය. විදුලිබල අලෙවියෙහි වැඩිවීමට එක් හේතුවක් වූයේ විදුලිබල පාරිභෝගිකයන් සංඛ්‍යාව 1993 දී 12,66,250 සිට 1994 දි 14,13,041 දක්වා වැඩිවීමය. විශේෂයෙන්ම ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රමයන්ගේ ව්‍යාප්තිය හේතුවෙන් 1994 වර්ෂයේදී ගෘහස්ථ පාරිභෝගිකයන් සංඛ්‍යාව 12,21,095 දක්වා සියයට 12 කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 1994 දී ගෘහස්ථ පාරිභෝගිකයන්ට කළ විදුලි අලෙවිය ගිගවොට් පැය 933 දක්වා සියයට 13 කින් වර්ධනය විය. ආර්ථික කටයුතුවල වැඩිවීම පෙන්නුම් කරමින් කර්මාන්ත අංශය සහ වාණිජ අංශයට ලං. වි. ම. විසින් කරණ ලද විදුලි අලෙවිය විමසුමට ලක් වන වර්ෂය තුළදී සියයට 7 කින් වැඩිවිය. ලං. වි. ම. මගින් පළාත්පාලන ආයතනවලට සහ ලංකා විදුලි සමාගමට කරන ලද තොග අලෙවිය පසුගිය වසරට වඩා 1994 දි සියයට 14 කින් ඉහළ ගියේය. ගෘහස්ථ සහ වාණිජ අංශයට කරණ ලද අලෙවිය විශාල ලෙස ඉහළයාම හේතුකොටගෙන ලංකා විදුලි සමාගමෙහි අලෙවිය සියයට 12 කින් වැඩිවිත.

විමසුමට ලක්වන වසර තුළදී ලං. වි. ම. විසින් විදුලිබල යටිතල පහසුකම් පුළුල් කිරීම, වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා රුපියල් දශලක්ෂ 3,700 ක් ආයෝජනය කරණ ලදී. එම මුළු ආයෝජනයෙන් අඩකට වැඩියෙන් වැය කරණු ලැබුයේ විදේශ ආර්ථික සහයෝගිතා අරමුදල (වි. ආ. ස. අ.) මගින් අරමුදල් සපයන ලද සම්ප්‍රේෂණ සැති වැඩි දියුණු කිරීම සහ සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 1,132ක් ) සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය (අ. ජා. සං. සං.) මගින් අරමුදල් සපයන ලද බෙදහැරීම් ව්‍යාප්ති සහ පුනරුත්ථාපන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 810) යන ව්‍යාපෘතින් දෙක සඳහාය. අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘතීන් වූයේ විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදහැරීම් ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 538 ක්), ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 385 ක්), නව ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රමය අදියර II (රුපියල් දශලක්ෂ 329ක් ) දෙවන විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදහැරීම් ව්‍යාපෘතිය( රුපියල් දශලක්ෂ 220) සහ රන්ටැඹේ විදුලිබල ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 136 ක් ) යනාදියයි. 1994 දී. ලං. වි. ම. විසින් එහි සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා වෙන් කරණ ලද වියදම් වලින් වැය කරනු ලැබුයේ සියයට 59 ක් පමණි. ඉහළ මට්ටමේ ඌන වියදම් අනුපාතයන් දරණ ලද ව්‍යාපෘතීන් ලෙස වාර්තා වූයේ සම්ප්‍රේෂණ හා උපපොළ සංවර්ධන ව්‍යාපෘතිය (සියයට 97) සහ සපුගස්කන්ද ඩීසල් ධාරිතාවය වැඩි කිරීමේ ව්‍යාපෘතිය (සියයට 99) යන ව්‍යාවෘතීන් දෙකයි.

### ඛනිජ තෙල් නිෂ්පාදන

පසුගිය වසර හා සසඳා බලන කල 1994 වර්ෂයේ දී බොරතෙල් ආනයන පරිමාව මෙට්‍රික් ටොන් 98,032 (සියයට 5) කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් 18,97,629 ක් ලෙස වාර්තා වී ඇත. ජාත්‍යන්තර වෙළෙඳපොලේ බොරතෙල් බැරලයක් සඳහා සාමාන්‍ය මිළ 1993 දි ඇ. එ. ජ. ඩොලර් 17.47 ක සිට 1994 දි ඇ. එ. ජ. ඩොලර් 16.31 දක්වා පහත වැටිනි. මෙය පසුගිය වසර පහක් තුළ වාර්තාගත වූ අඩුම මිළ විය. 1994 දි පැවැති මෙම හිතකර මිළ ප්‍රවනතාවයන් පිළිබිඹු කරමින් බොරතෙල් සඳහා වූ මුළු පිරිවැය රුපියල් වටිනාකම අනුව සියයට 2 කින් පමණක් ඉහළ ගිය අතර විගැහි වටිනාකම අනුව සියයට 3 කින් පහත වැටිනි. 1994 වසරේදී ආනයනය කළ පිරිපහදු කළ ඛණිජ තෙල් නිෂ්පාදන මෙට්‍රික් ටොන් 2,88,328 ක් වූ අතර එය 1993 දී ආනයනය කළ ප්‍රමාණයට වඩා සියයට 2ක අඩුවිමකි. 1994 දී කොළඹ ගෑස් සමාගම මගින් ආනයනය කළ ද්‍රවීකරණය කළ ඛණිජතෙල් ගෑස් (එල්. පී. ගෑස්) ප්‍රමාණය මෙට්‍රික් ටොන් 50,193 දක්වා සියයට 34 කින් ඉහළ ගිය අතර එහි වටිනාකම රුපියල් දශලක්ෂ 704 දක්වා සියයට 29 කින් වැඩිවුණි.

මෙම තත්ත්වයන් පිළිබිඹු කරමින් මුළු ආනයන වියදමින් ඛණිජතෙල් ආනයන සඳහා වූ වියදම 1993 දි සියයට 7.7 ක සිට 1994 දී සියයට 6.2 දක්වා පහත වැටිනි.

1994 වසර තුළ අවස්ථා කිහිපයකදි ඇතැම් ප්‍රධාන ඛනිජතෙල් නිෂ්පාදනයන්ගේ මිළ ප්‍රතිශෝධනය කිරීමට සිදුවිය. ඩීසල් මිළ ලීටරයකට රු. 12.20 සිට පෙබරවාරි මසදී රු. 12.30 දක්වාද, මාර්තු අගදී රු. 12.40 දක්වාද දෙවතාවකදී ඉහළ නැංවිය. 1994 සැප්තැම්බර් මස අගදී සුදු ඩීසල් ලීටරයක මිළ රුපියල් 11.40 දක්වා රුපියලකින් පහත හෙළන ලද අතර, භූමිතෙල් ලීටරයක මිළ රුපියල් 9.50 දක්වා රුපියල් 2.30 කින් පහත දමන ලදී. ජාත්‍යන්තර ඛනිජ තෙල් මිළ ගණන් අඩුවීම නිසා ලංකා ඛනිජ තෙල් සංස්ථාවට (ලං. ඛ. සං.) ලැබුණු අතිරේක ලාභවලින් කොටසක් දේශීය පාරිභෝගිකයන් වෙත විතැන් කිරීමක් මෙම මිළ අඩුකිරීම් මගින් සිදුවිය.

1994 වසරේදි ඛණිජතෙල් නිෂ්පාදනයන්ගේ ගෘහස්ථ පරිභෝජනය ඊට පෙර වර්ෂයේ සියයට 5 ක පහත වැටීම හා සසඳන කල සියයට 11 කින් ඉහළ ගොස් ඇත. මෙම පරිභෝජන වර්ධනය සියළුම වර්ගයේ ඛණිජතෙල් නිෂ්පාදනයන් තුලින් පිළිබිඹුවේ. 1992 සිට සැලකිය යුතු ලෙස යුතු ලෙස වර්ධනය වූ සුදු ඩීසල් පරිභෝජනය 1994 දි සියය 10 කින් ඉහළ ගියේය. මෙම ප්‍රවනතාවයම පෙන්නුම් කරමින් පෙට්‍රල් සඳහා ඉල්ලුම පසුගිය වර්ෂයේ වූ සියයට 5 ක වර්ධනය සමග සසඳන විට මෙම වසරේදි මෙට්‍රික් ටොන් 1,83,680 ක් දක්වා සියයට 6 කින් වර්ධනය විය. 1994 දී මෙට්‍රික් ටොන් 53, 902 ක් වූ බැර ඩීසල් පරිභෝජනය ඊට පෙර වර්ෂයට වඩා තුන් ගුණයකින් ඉහළ ගියේය. එයට හේතු වූයේ තාප බල උත්පාදනය සඳහා බැර ඩීසල් භාවිතය වැඩි වීමය. දැව් තෙල් අලෙවිය 1994 දී මෙට්‍රික් ටොන් 2,28,345 දක්වා සියයට 4කින් වර්ධනය විය. විමසුමට ලක් කෙරෙන කාලච්ඡේදය තුළදී විදුලිබල උත්පාදනය හැර වෙනත් කටයුතු සඳහා දැව්තෙල් භාවිතය මෙට්‍රික් ටොන් 1,92,100 දක්වා සියයට 9 කින් වැඩි විය. පසුගිය වර්ෂයේදී සුළු වශයෙන් වැඩිවුණු භූමිතෙල් සඳහා පැවති ඉල්ලුම 1994 දී මෙට්‍රික් ටොන් 2,06,929 ක් දක්වා සියයට 8 කින් ප්‍රසාරණය විය. භූමිතෙල් භාවිතයේ ඉහළ යාම වසරේ සිවුවන කාර්තුවේදී වඩාත් කැපී පෙණුනි. භූමිතෙල් පරිභෝජනය අදල වසරේ අවසාන කාර්තුවේදී පසුගිය වසරේ සම කාලය හා සසඳන කළ සියයට 14 කින් ඉහළ ගියේය. මේ අතර පසුගිය පස් වසර තුළ වාර්තා ගතවූ අධිකතම ඉහළයෑම පෙන්නුම් කරමන් එල්. පි. ගෑස් සඳහා ඉල්ලුම 1994 දී මෙට්‍රික් ටොන් 64,257 දක්වා සියයට 22 කින් වර්ධනය විය. මෙම ඉහළ යාමෙන් සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයකට දයක වූයේ ගෘහස්ථ අංශයේ පරිභෝජනය ඉහළ යාමය.

## ප්‍රවාහනය

1994 වර්ෂයේදී ප්‍රවාහන අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් වාර්තා කළේය. ධාවන පරිමාව අනුව බලන කල, ජනතා සන්තක සමාගම් සහ පෞද්ගලික අංශයේ මගී ප්‍රවාහන සේවා වර්ෂය තුළදී තවදුරටත් වර්ධනය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (ශ්‍රී. ලං. දු.සේ.) ධාවන කටයුතු නොකඩවා තෙවැනි වසරටත් නොවෙනස්ව පැවතුණි.

### බස් ප්‍රවාහනය

#### ජනතා සන්තක හා පෞද්ගලික අංශය

වසර අවසාන වන විට ජනතා සන්තක සමාගම් 93 ක් ක්‍රියාත්මකව පැවතුණි. පසුගිය වසරේ මෙන්, අළුතින් බස් රථ මිළදී ගැනීම සහ පැවති බස් රථ අළුත්වැඩියා කිරීම මගින් ධාවනය කෙරෙන බස් රථ ඇතිය තර කිරීම සඳහා ජනතා සන්තක සමාගම් සාමූහික ප්‍රයත්නයක් දරණ ලදි. 1994 වසරේදී, ජනතා සන්තක සමාගම් විසින් පැවති බස්රථ සංඛ්‍යාවට නව බස්රථ 1,600 'ක් එකතු කරන ලදි. බස් රථ සංඛ්‍යාවේ වැඩිවීම හේතුවෙන් ජනතා සන්තක සමාගම් විසින් දිනකට ධාවනය කරනු ලබන සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 1993 දී පැවති 3,709 සිට 1994 දී 4,261 දක්වා ඉහළ ගියේය. බස් රථ සංඛ්‍යාවේ වැඩි වීමක් පැවතුනද, 1994 වසර අවසානයේදී ජනතා සන්තක සමාගම් වල ධාවනයට යොදා ගත හැකි බස් රථ සංඛ්‍යාව, මහජනයාට කාර්‍යක්ෂම සේවාවක් සැපයීමට අවශ්‍ය උපරිම බස් රථ සංඛ්‍යාවෙන් සියයට 75 ක් පමණක් විය. මෙවන් තත්ත්වයක් යටතේ ජනතා සන්තක සමාගම් මගින් ධාවනය කෙරුණු කිලෝමීටර් ගණන පසුගිය

වසරට වඩා සියයට 13 කින් ඉහළ ගොස් කිලෝමීටර් දශලක්ෂ 307 ක් විය. ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව අනුව බලන කළ ජනතා සන්තක සමාගම්හි මගී කිලෝමීටර් ප්‍රමාණය දශලක්ෂ 15,613 ක් ලෙස ඇස්තමේන්තුකර ඇති අතර, මෙය පසුගිය වසරට වඩා සියයට 15 කින් ඉහළ ගොස් ඇත. මේ අතර, 1994 වර්ෂයේ ජනතා සන්තක සමාගම් වල ඇස්තමේන්තුගත ආදායම ඊට පෙර වර්ෂයට වඩා සියයට 16 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 3,528 ක් විය. බස් රථ ආනයනය කිරීම සහ බස් රථ එකලස් කිරීමේ කටයුතු සම්බන්ධ යෝජනා ක්‍රමය වසර පුරාම අඛණ්ඩව පැවතිණ. 1994 වසර අවසානයේදී එම ව්‍යාපෘතිය මගින් බස් රථ 2,397 ක් පෞද්ගලික අංශයට සහ ජනතා සන්තක සමාගම් වලට සපයන ලදී.

## 1.31 සංඛ්‍යා සටහන

## ගමනාගමන අංශයේ මූලික ලක්ෂන 1993 - 1994

| ශීර්ෂය | ඒකකය | 1993 | 1992 ට වඩා ප්‍රතිශත වෙනස | 1994 ✻ | 1993 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් | | | | | |
| 1.1 පෞද්ගලික මගී ප්‍රවාහන බස්රථ✻✻ | සංඛ්‍යාව | 1,835 | -26.0 | 3,347 | 82.4 |
| 1.2 පෞද්ගලික මෝටර්රථ ✻✻✻ | ” | 16,802 | -16.7 | 22,517 | 34.0 |
| 1.3 මෝටර් බයිසිකල් | ” | 53,934 | -18.1 | 36,791 | -31.8 |
| 1.4 භාණ්ඩ ප්‍රවාහන වාහන | ” | 4,948 | 19.3 | 5195 | 5.0 |
| 1.5 ඉඩම් වාහන | ” | 6,646 | 21.1 | 7,160 | 7.7 |
| 1.6 වෙනත් | ” | 8 | -94.0 | 34 | 325.0 |
| 1.7 පෞද්ගලික බස්රථ | ” | 295 | -30.6 | 476 | 61.4 |
| 2. ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) | | | | | |
| 2.1 ධාවන කිලෝමීටර් | දශලක්ෂ | 8.2 | - | 8.2 | - |
| 2.2 මගී කිලෝමීටර් | ” | 2,821.6 | 8.0 | 3,229.0 | 14.5 |
| 2.3 බඩු ටොන් කිලෝමීටර් | ” | 159.2 | -10.1 | 151.3 | -5.0 |
| 2.4 මුළු ආදායම | රු. ද. ල. | 820 | -7.3 | 900 | 9.8 |
| 2.5 වර්තන වියදම් | ” | 1,236 | -0.2 | 1,686 | 36.4 |
| 2.6 අතිරික්තය (+) හිගය(-) | ” | -416 | 17.8 | -786 | 88.9 |
| 3. ජනතා සන්තක සමාගම් | | | | | |
| 3.1 ධාවන කිලෝමීටර් | දශලක්ෂ | 272.2 | 1.5 | 306.5 | 12.6 |
| 3.2 මගී කිලෝමීටර් | ” | 13,608.0 | 6.0 | 15,613.1 | 14.7 |
| 3.3 මුළු ආදායම | රු. ද. ල. | 3,043.7 | 11.2 | 3,528.5 | 15.9 |

✻ තාවකාලික.
✻✻ ජනතා සන්තක සමාගම් යටතේ ලියාපදිංචි කරන ලද බස් රථ ද අයත්වේ.
✻✻✻ ද්විත්ව කාර්ය වාහන ද ඇතුලත්වේ.

මූලයන් : ශ්‍රී ලංකා දුම්රිය සේවය
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා
ජාතික ප්‍රවාහන කොමිසම

විමසුමට ලක් වන වර්ෂය තුළදී මගී සේවා දියුණු කිරීම පිණිස ජාතික ප්‍රවාහන කොමිසම මගින් ඇතැම් ක්‍රියාමාර්ගයන් හඳුන්වා දෙන ලදී. බොහෝ සමාගම්වල කළමනාකාරීත්වය වෙනස් කිරීම සහ එම සමාගම් වාණිජ ව්‍යාපාර ලෙස පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය මග පෙන්වීම කරන ලදී. ග්‍රාමීය ප්‍රදේශ කරා බස් සේවාව ව්‍යාප්ත කිරීම උනන්දු කිරීමේ අරමුණින් මාර්ග බලපත් සඳහා වෙනස්වන ගාස්තු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ අතර, මගී පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා උස් පියැසි බස් රථ සහ ආසන 30 ට වැඩි බස් රථ මිළදී ගැනීමට පෞද්ගලික බස් රථ හිමියන් උනන්දු කිරීම සඳහා පියවර ගැනුනි. ඊට අමතරව, පෞද්ගලික බස් රථ හිමියන් සහ ජනතා සන්තක බස් රථ සමාගම් සපයන සේවාවන් වඩා හොඳින් සම්බන්ධීකරණය කිරීමට පළාත් පාලන ආයතන උනන්දු කරවනු ලැබිය.

විමසුමට ලක් කරන වර්ෂය තුළදී පෞද්ගලික අංශය විසින් සපයන ලද මගී සේවාවන් ද තවදුරටත් වර්ධනය විය. මෝටර් රථ දෙපාර්තමේන්තුවෙහි අළුතින් ලියාපදිංචි කරණ ලද මගී ප්‍රවාහන බස් රථ සංඛ්‍යාව (ජනතා සන්තක සමාගම්වල බස් රථ ඇතුළුව) පසුගිය වසර හා සසඳා බලන විට 1,835 ක සිට 3,347 දක්වා සියයට 82 කින් ඉහළ ගියේය. මේ අතරතුර විමසුමට ලක්වන කාලපරිච්ඡේදය තුළ පළාත් සභා හතෙහි මගී ප්‍රවාහන දෙපාර්තමේන්තු සහ ජාතික ප්‍රවාහන කොමිසම මගින් පෞද්ගලික අංශයේ ධාවකයන් වෙත අළුත් ධාවන බලපත් 2,417 ක් නිකුත් කරන ලදි. රාජ්‍ය බැංකු දෙක සහ ජාතික සංවර්ධන බැංකුව බස් රථ ආනයනය සහ එකලස් කිරීමේ වැඩපිළිවෙල යටතේ සපයන ලද ණය පහසුකම් හේතුකොටගෙන පෞද්ගලික අංශයේ මගී ප්‍රවාහන කටයුතු වර්ෂය තුළදී තවදුරටත් වර්ධනය විය.

## දුම්රිය ප්‍රවාහනය

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කිලෝමීටර් ප්‍රමාණය දශලක්ෂ 8.2 ක් ලෙස 1992 සහ 1993 වර්ෂයේ පැවති මට්ටමේම නොවෙනස්ව පැවතිණි. දුම්රිය සේවයේ ධාවන කටයුතු නොවෙනස්ව පැවතිය ද, දුම්රිය සේවය මගින් සැපයෙන මගී සේවාවන්ට ඇති ඉල්ලුමේ ප්‍රසාරණයක් පිළිබිඹු කරමින් 1994 වර්ෂයේදී ලංකා දුම්රිය සේවයේ මගී කිලෝ මීටර් සංඛ්‍යාව දශලක්ෂ 3,230 දක්වා සියයට 15 කින් වර්ධනය විය. බඩු ටොන් කිලෝමීටර ප්‍රමාණය මගින් පෙන්නුම් කළ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පසුගිය වසරේ වූ සියයට 10 ක අඩුවීම හා සසඳන විට 1994 දී ටොන් දශලක්ෂ 151 දක්වා සියයට 5 කින් පහත වැටුණි.

විමසුමට ලක්වන වර්ෂයේදී, ලංකා දුම්රිය සේවයේ ධාවන කටයුතු කෙරෙහි විවිධ සාධක බලපා ඇත. පසුගිය වසර වල මෙන්ම උතුරු පළාතෙහි දුම්රිය සේවා සීමා කිරීම් තවදුරටත් ක්‍රියාත්මක විනි. උතුරට ධාවනය වන දුම්රිය තන්ඩිකුලම් දක්වා ධාවනය වූ අතර, තලෙයිමන්නාරම දුම්රිය මාර්ගයෙහි ධාවන කටයුතු සම්පූර්ණයෙන්ම අත්හිටුවන ලදි. කොළඹ මඩකලපුව දුම්රිය මාර්ගයෙහි දෛනික සේවාව 1994 අගෝස්තු මාසයේදී ඇරඹිණි. මේ අතර, ප්‍රමාණවත් තරම් දුම්රිය එන්ජින් නොමැති වීම සහ දුම්රිය මාර්ගවල දුර්වල තත්ත්වය දුම්රිය සේවාව ප්‍රමාණවත් අන්දමින් සහ නියමිත වේලාවනට සැපයීම කෙරෙහි අහිතකර අන්දමින් බලපෑවේය. දුම්රිය සේවාව තවදුරටත් පිරිහීම වළක්වා ගැනීම පිණිස වාහන තදබදය අධික වූ නගරාසන්න ප්‍රදේශවල දුම්රිය මාර්ග පිළිසකර කිරීම සඳහා ක්ෂණික වැඩපිළිවෙලක් ලංකා දුම්රිය සේවාව විසින් වර්ෂයේ අවසාන භාගයේදී හඳුන්වා දෙන ලදි. මීට අමතරව මාතර කතරගම දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු තවදුරටත් ඉදිරියට ගෙන යමින් මාතර සිට වලස්ගල දක්වා දිවෙන එහි පළමු අදියර වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරිණි. කැළණිවැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු වල පාදුක්ක දක්වා වූ තෙවන අදියර වර්ෂය අවසාන වන විට නිමකිරීමට හැකිවිය.

1994 වර්ෂයේදී ලංකා දුම්රිය සේවයේ වර්තන වියදම් රුපියල් දශලක්ෂ 1,686 දක්වා සියයට 36 කින් ඉහළ ගියේය.මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ වැඩිවුනු වැටුප් වියදම සහ ඉහළ මට්ටමක පැවති අළුත් වැඩියා කිරීම් හා නඩත්තු කිරීමේ වියදමයි. විමසුමට ලක්වන වර්ෂයේදී මුළු ආදායම රුපියල් දශලක්ෂ 900 දක්වා සියයට 10 කින් ඉහළ ගියේය. ආදායමේ මන්දගාමී වර්ධනය හා වර්තන වියදම්වල සීඝ්‍ර වර්ධනය හේතුවෙන් 1994 වර්ෂයේදී මෙහෙයුම් අලාභය රුපියල් දශලක්ෂ 786 ක් වූ අතර, ඒ හා සැසඳෙන 1993 අලාභය රුපියල් දශලක්ෂ 416 ක් විය.

යෝජිත දුම්රිය අධිකාරිය පිළිබඳ පනත 1993 නොවැම්බර් මස 9 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරිණි. ශ්‍රී. ලං. දු. සේ. දුම්රිය අධිකාරියක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සපයාදීමට ලෝක බැංකුව එකඟ වී ඇත.

## මහා මාර්ග සහ දුම්රිය මාර්ග

1994 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය (මා. සං. අ.) විසින් කිලෝ මීටර් 11,076 ක මාර්ග පද්ධතියක් සහ පාලම් 3,760 ක්ද, නඩත්තු කරන ලදී. තවද මා. සං. අ. විසින් 1994 වසර තුළදී මාර්ග ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 2,936 ක්ද නඩත්තු කිරීම් සඳහා රුපියල් දශලක්ෂ 177 ක්ද වැය කෙරිණි.

සලකා බලන වර්ෂය තුලදී මා. සං. අ. මගින් "ඒ" සහ "බී" ශ්‍රේණියේ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම අඛණ්ඩව කරගෙන යන ලදී. 1994 වර්ෂය තුළදී ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද දෙවන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අවිස්සාවේල්ල- හැටන්-නුවරඑළිය මාර්ගයෙහි අවිස්සාවේල්ල-හැටන් (කිලෝමීටර් 72.5) කොටසෙහිද කොළඹ -රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයෙහි හෝමාගම-රත්නපුර කොටසෙහිද (කිලෝමීටර් 74) ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව සිදු කෙරිනි. මේ අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං. සං.) මගින් අරමුදල් සපයන ලද තෙවන මාර්ග ව්‍යාපෘතිය යටතේ කොළඹ-ගාල්ල-හම්බන්තොට -වැල්ලවාය මාර්ගයෙහි පානදුර-ගාල්ල කොටස (කිලෝමීටර් 92), 1994 වර්ෂය අවසානයේදී නිම කෙරිනි. එම ව්‍යාපෘතිය යටතේම තොප්පු-දංකොටුව-ගිරිඋල්ල මාර්ගයද, කටුනායක-වේයන්ගොඩ-නිට්ටඹුව මාර්ගයද, සීදූව-උඩගම්පොල මාර්ගයද, බියන්විල - ගනේමුල්ල මාර්ගයද, මීගමුව නාගරික මාර්ගද (මුළු ගණන කිලෝමීටර් 79.5 ක්) වැඩිදියුණු කෙරෙමින් පැවතිනි. සැලකිල්ලට ලක් කෙරෙන වර්ෂය තුළදී ගාලු මාර්ගයට විකල්ප මාර්ගයක් ලෙස කළුතර සිට කොළඹ සහ ශ්‍රී ජයවර්ධනපුර දක්වා වූ මාර්ගයෙහි වස්කඩුව-බණ්ඩාරගම-කැස්බෑව මාර්ගයේ ඉදිකිරීම් කටයුතුද, පෑලියගොඩ -පුත්තලම මාර්ගයෙහි පෑලියගොඩ කටුනායක කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ද නොකඩවා සිදු කරණ ලදි. රුපියල් දශලක්ෂ 176 ක වියදමකින් සිදු කෙරුණු නව කැළණි පාලමෙහි අළුත්වැඩියා කිරීම් 1994 අවසානයේදී නිම කෙරිණි .දැනට පවත්නා සංවර්ධන ව්‍යාපෘතීන්ට අමතරව 1994 වර්ෂය තුළදී මා. සං. අ. මගින් මාර්ග සහ පාලම් ඉදි කිරීමේ නව ව්‍යාපෘතින්ද ආරම්භ කරන ලදි. මහවැලි ගඟ හරහා ලේවැල්ල පාලම ඉදි කිරීමද අඹේපුස්ස- කුරුණෑගල -ත්‍රිකුණාමලය මාර්ගය, අල්ල-කන්තලේ මාර්ගය, මරදන්කඩවල-හබරන- තිරුක්කොන්ඩායිමඩු මාර්ගය යන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය පළල් කිරීම යන ව්‍යාපෘතීන් 1994 වර්ෂය තුළදී ආරම්භ කරණ ලදි.

විමසුමට ලක් කෙරෙණ වර්ෂය තුළදී කිලෝමීටර් 1,952 ක් වූ දුම්රිය මාර්ග පද්ධතිය නොවෙනස්ව පැවතුනි. මාතර සිට වලස්ගල දක්වා දිවෙන කිලෝමීටර් 17 ක්වූ දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු වසර තුළදී සිදුවෙමින් පැවතිනි. දැනට පවත්නා දුම්රිය මාර්ගවල අසතුටුදායක තත්ත්වය මගහැරීම පිණිස වර්ෂය අවසාන භාගයේදී කඩිනම් පියවර ගන්නා ලදී.

## නිවාස ඉදිකිරීම්

1994 වර්ෂයේදී නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය අංශයේ ප්‍රධාන නිවාස වැඩසටහන්වල ක්‍රියාකාරීත්වය පසුබෑමකට ලක් විය. කෙසේ වුවද, පෞද්ගලික අංශයේ නිවාස ඉදිකිරීම් කටයුතු සංවර්ධනය සඳහා ප්‍රධාන බැංකු සහ මූල්‍යායතන විසින් සපයනු ලැබූ ණය පහසුකම්, පසුගිය වර්ෂය සමග සසඳා බලන කල සැළකියයුතු වර්ධනයක් පෙන්නුම් කළේය.

නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරු වන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ජා. නි. ස. අ. සෘජු සහයෝගිත්වයෙන් යුතුව නිවාස උපවැඩසටහන සහ නාගරික නිවාස උපවැඩසටහන යන රාජ්‍ය අංශයේ ප්‍රධාන නිවාස උපවැඩසටහන් දෙක ක්‍රියාත්මක විනි. මෙම වැඩසටහන් දෙක ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල අඩු ආදායම් ලබන පවුල්වල නිවාස තත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වුනි. පසුගිය වර්ෂය හා සසඳා බලන කල 1994 දී මෙම නිවාස උපවැඩසටහන් දෙකෙහි කටයුතු සැළකියයුතු පසුබෑමකට ලක්ව් ඇත. ග්‍රාමීය නිවාස උපවැඩසටහනෙහි කටයුතු ,ණය ලබා දුන් පවුල් සංඛ්‍යාව අනුව බලන කල, 1993 පැවැති 31,368 සිට 1994 දී 23,911 දක්වා පහත වැටුණි. සම්පූර්ණ කරණ ලද ඒකක සංඛ්‍යාව 1993 දී 31,641 සිට 1994 දී 23,439 දක්වා පහත වැටුණි. මෙම වැඩසටහන යටතේ මුදා හරින ලද ණය සහ

## 1.32 සංඛ්‍යා සටහන
## නිවාස 15 ලක්ෂයේ වැඩ සටහනෙහි ක්‍රියාකාරීත්වය 1990 - 1994 (අ)

| උප - වැඩසටහන | ණය ලබා ගත් පවුල් ගණන | | | | | නිමකල ඒකක ගණන | | | | | මුද හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993 | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993 | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993 | 1994(ආ) |
| ග්‍රාමීය නිවාස උප - වැඩසටහන | 25,496 | 30,429 | 38,710 | 31,368 | 23,911 | 13,655 | 24,071 | 22,846 | 31,641 | 23,439 | 154.6 | 243.4 | 259.5 | 296.2 | 217.7 |
| නාගරික නිවාස උප වැඩසටහන | | | | | | | | | | | | | | | |
| අඩු ආදයම් ලබන පවුල් | 5,377 | 5,806 | 6,170 | 7,268 | 4,423 | 2,954 | 5,627 | 3,487 | 5,357 | 4,480 | 32.6 | 54.2 | 87.9 | 96.9 | 72.1 |
| විශේෂ නාගරික මධ්‍යම ආදයම් ලබන පවුල් | - | 16 | 590 | 295 | 284 | - | 16 | 590 | 295 | 284 | - | 222.7 | 211.9 | 215.5 | 210.7 |
| පළාත් සභා නිවාස උප-වැඩසටහන(ඇ) | 1,070 | 1,422 | 2,141 | 1,639 | 776 | 128 | 1,160 | 1,006 | 1,202 | 934 | 3.9 | 10.0 | 12.9 | 13.5 | 8.4 |
| ආපද නිවාස උප-වැඩසටහන(ඇ) | 15,344 | 14,094 | 13,969 | 8,538 | 9,758 | 3,862 | 6,161 | 9,163 | 7,821 | 10,109 | 99.0 | 142.7 | 169.0 | 256.5 | 205.8 |
| වතුකරයේ නිවාස උප-වැඩසටහන (ඇ) | 121 | 313 | 228 | 570 | 363 | 121 | 313 | 228 | 570 | 363 | - | - | 7.0 | 7.2 | |
| මහවැලි නිවාස උප-වැඩසටහන | 9,751 | 4,721 | 3,505 | 3,735 | 1,188 | 4,129(ඉ) | 3,714(ඉ) | 5,968(ඉ) | 3,105(ඉ) | 2,225(ඉ) | 31.1(ඊ) | 15.8(ඊ) | 25.4(ඊ) | 14.7(ඊ) | 5.9(ඊ) |
| සේවක නිවාස උප-වැඩසටහන(ඇ) | - | - | 249 | 274 | - | - | - | - | 146 | 96 | - | - | 3.6 | 11.7 | 2.3 |
| මුළු ගණන | 57,159 | 56,801 | 65,562 | 53,687 | 40,726 | 24,849 | 41,062 | 43,288 | 50,137 | 41,930 | 321.2 | 688.9 | 770.2 | 912.0 | 730.1 |

(අ) නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන යටතේ උප වැඩසටහන් කීපයක් පමණක් සංඛ්‍යා සටහනට ඇතුලත් වේ.
(ආ) තාවකාලික
(ඇ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කටයුතු පමණි.
(ඇ) 1990-1992 දක්වා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ 1993 සිට "වතුකරයේ නිවාස සහ සමාජ සුහසාධන භාරකාර මණ්ඩලය" වෙත මාරු කරන ලදී.
(ඉ) මහවැලි ආර්ථික ඒජන්සිය යුරෝපා ආර්ථික කොමිසමේ ණය ක්‍රමය යටතේ නිම කරන ලද ඒකක සහ උප පවුල් විසින් නිම කරන ලද නිවාස, 1990,1991 සහ 1992 වර්ෂවලට ඇතුලත්වේ.
(ඊ) මහවැලි ආර්ථික ඒජන්සිය සහ යුරෝපා ආර්ථික කොමිසම මගින් නව පදිංචි කරුවන් සඳහා කරන ලද ප්‍රදානයන්.

මූලයන්: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
මහවැලි ආර්ථික ඒජන්සිය,
ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ
වතුකරයේ නිවාස සහ සමාජ සුහ සාධන
භාරකාර මණ්ඩලය.

ප්‍රදානයන්ද පසුගිය වසර සමඟ සසඳන විට සියයට 27 කින් අඩුවිය. මේ හා සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කරමින් සපයන ලද අළුත් ණය සහ සම්පූර්ණ කරණ ලද ඒකක අනුව නාගරික නිවාස උපවැඩසටහනෙහි ක්‍රියාකාරිත්වයද සැලකියයුතු ලෙස පහත වැටුණි. 1994 දී නාගරික නිවාස උපවැඩසටහන මගින් පවුල් 4,707 කට ණය පහසුකම් සැපයීමට හැකි වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 38 කින් පහළ යාමකි. මෙම වැඩසටහන යටතේ සම්පූර්ණ කරණ ලද ඒකක සංඛ්‍යාව 1993 දී 5,652 සිට 1994 දී 4,764 දක්වා පහත වැටුනි. ඒ අනුව නාගරික නිවාස උපවැඩසටහන මගින් ලබා දෙන ලද ණය ප්‍රමාණය 1993 දී රුපියල් දශලක්ෂ 313 සිට 1994 දී රුපියල් දශලක්ෂ 282 දක්වා අඩුවිය. ජා.නි.සං.අ. යේ සහයෝගිත්වයෙන් යුතු රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහනෙහි පසු බැමට ප්‍රධාන හේතුන් වූයේ අරමුදල් ඌණතාවය හා වසරේ දෙවන භාගයේදී ණය ආපසු ගෙවීමේ අනුපාතිකයන් අඩු මට්ටමක පැවතීමයි. 1994 වසර අවසානයේදී ජා.නි.සං. අ.යේ සහයෝගිත්වය ලැබූ වැඩසටහන්වල ණය ආපසු ගෙවීමේ අනුපාතය සියයට 37 ක් පමණක් විය. මේ අතර නව රජයේ නිවාස ප්‍රතිපත්තිය හා අනුකූලව ජා.නි.සං.අධිකාරිය විසින් නව වැඩසටහනක් සැළසුම් කරණ ලදි.

ආපද නිවාස උප වැඩසටහන ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මකවිණි. මෙම වැඩ සටහන සඳහා සහයෝගය දෙනු ලැබුයේ ජා.නි.සං.අ., සංවර්ධන මූල්‍ය සංස්ථාව, වාණිජ බැංකු සහ ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යංශයේ අනුග්‍රහය ලැබූ රජයේ නියෝජිතයන්ය. මෙම වැඩසටහන යටතේ, 1993 දී ණය දුන් පවුල් 8,538 හා සැසඳීමේදී 1994 දී පවුල් 9,758 කට ණය පහසුකම් ලබාදීමට හැකිවිය. වැඩසටහන යටතේ 1994 සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව 10,109 ක් විය. මේ අතර ජා.නි.සං.අ. විසින් පළාත් සභා නිවාස උප වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පලාත් සභා වලට සහයෝගය දෙනු ලැබිය. විමසුමට ලක් කරන කාලපරිච්ඡේදයේදී එම වැඩසටහන මගින් පවුල් 776 කට ණය ලබාදුන් අතර, එය පසුගිය වසරට වඩා සියයට 53 ක පහත වැටීමකි. වර්ෂය තුළදී මෙම වැඩසටහන යටතේ නිවාස ඒකක 934 ක් සම්පූර්ණ කර ඇත.

වැවිලි නිවාස උප වැඩසටහන ද මෙම වසරේ පසුබැමක් වාර්තා කළේය. වර්ෂය තුළදී සේවක නිවාස සෙවිලි කිරීමේ යෝජනා ක්‍රමය සහ අත්තම් නිවාස යෝජනා ක්‍රමය යටතේ වැවිලි නිවාස සහ සමාජ සුභසාධන භාරකාර මණ්ඩලයට සම්පූර්ණ කිරීමට හැකි වූයේ නිවාස 363 ක් පමණි. මේ අතර, විමසුමට ලක් කරන වර්ෂය තුළදි මහවැලි ආර්ථික ඒජන්සිය විසින් මහවැලි නිවාස උපවැඩසටහන යටතේ බී. සී. සහ එච් කලාපවල නිවාස ඒකක 2,225 ක් තනා නිම කරන ලදි.

1994 වර්ෂය තුළදී ප්‍රධාන බැංකු සහ මූල්‍යායතන විසින් පෞද්ගලික අංශයේ නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා සපයනලද ණය පහසුකම්වල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. නිවාස ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද මුළු ණය ප්‍රමාණය 1993 දි වූ රුපියල් දශලක්ෂ 2,212 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 2,707 දක්වා සියයට 22 ක ඉහළ යෑමක් වාර්තා කෙරිණි. පසුගිය වර්ෂයේ මෙන්ම ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික රක්ෂණ සංස්ථාව සහ සමූපකාර ග්‍රාමීය බැංකු මගින් ණය ලබා දීම දිවයින පුරා නොකඩවා කරගෙන යන ලදි. ලංකා බැංකුව මගින් 1994 වර්ෂය තුළ ලබාදුන් ණය සංඛ්‍යාව 2,622 දක්වා සියයට 17 කින් ඉහළ ගිය අතර, ලබාදුන් ණය මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,214 දක්වා සියයට 27 කින් ඉහළ ගියේය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් ලබාදුන් ණය සංඛ්‍යාව 4,474 දක්වා සියයට 26 ක සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගිය අතර, සපයනු ලැබූ ණය මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 763 දක්වා සියයට 64 කින් වර්ධනය විය. විමසුමට ලක් කෙරුණු වර්ෂය තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ද නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 239 ක් අයදුම්කරුවන් 1,024 කට ප්‍රදානය කරනු ලැබිය. ඉකුත් වසරේදී මෙම බැංකුව මගින් රුපියල් දශලක්ෂ 156 ක් අයදුම්කරුවන් 985 ක් සඳහා ප්‍රදානය කෙරිණි. මේ අතර, මහජන බැංකුව විසින් ප්‍රදානය කරණු ලැබූ ණය සංඛ්‍යාව 1993 දී 10,258 සිට 1994 දී 6,291 දක්වා පහත වැටුන අතර, දෙනු ලැබූ ණය මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 414 සිට රුපියල් දශලක්ෂ 226 දක්වා පහත වැටිනි. නිවාස ණය සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රය ක් වන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, එහි ආරම්භයේ සිට මේ දක්වා එක් වසරක් තුළ වැඩිම සංඛ්‍යාවකට ණය නිකුත් කළ වර්ෂය වාර්තා කරමින් අයදුම්කරුවන් 2,738

දෙනෙකුට රුපියල් දශලක්ෂ 259 ක් ලබා දී ඇත. තවද, විමසුමට ලක්වන වර්ෂය තුළදී සමූපකාර ග්‍රාමීය බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සකසුරුවම් හා සමූපකාර ණය දෙන සමිති ද, පෞද්ගලික අංශයේ නිවාස ඉදිකිරීම් සඳහා ලබාදුන් මූල්‍ය පහසුකම් පුළුල් කරන ලදි.

## නාගරික සංවර්ධනය

විමසුමට ලක්වන වසර තුලදි නාගරික සංවර්ධන අධිකාරියේ (නා. සං.අ.) කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය විය. නා. සං. අ. විසින් විවිධ ව්‍යාපෘතීන් සඳහා කරනු ලැබූ මුළු වියදම පසුගිය වර්ෂය සමහ සසඳා බලන කළ 1994 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 1,071 ක් දක්වා සියයට 52 කින් ඉහළ ගියේය.

මුළු වියදමින් සියයට 46 ක් හෙවත් රුපියල් දශලක්ෂ 482 ක්ම බත්තරමුල්ල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් වැය කෙරිණි. අනුග්‍රාහකයින් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශලක්ෂ 460 ක් වැය කෙරිණි. වර්ෂය තුළදී අනුග්‍රාහකයින් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘතීන් අතර ප්‍රධාන ව්‍යාපෘතීන් වූයේ මාදිවෙල නිවාස සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 118) සහ පැලියගොඩ ගබඩා සංකීර්ණය (පියවර 2) (රුපියල් දශලක්ෂ 221) ඉදිකිරීමත්ය. වාණිජ සංකීර්ණයන් ඉදිකිරීම, නගර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතීන්, කාර්මික සංකීර්ණයන්, ඒකාබද්ධ ව්‍යාපෘතීන් හා සමාජ සංස්කෘතික ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශලක්ෂ 60 ක්ද නා. සං. අ. මගින් වැය කරණ ලදී. තවද සංවර්ධනය නොකරණ ලද හෝ මුඩුබිම් මිලදී ගැනිම සඳහා නා. සං. අ. හි ඉඩම් බැංකුව විසින් රුපියල් දශලක්ෂ 50 ක් වැය කරන ලදී.

## පණිවිඩ හුවමාරු

1994 වර්ෂය තුළ තැපැල් කටයුතු තවදුරටත් පුළුල් විය. තැපැල් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද තැපැල් භාණ්ඩ සංඛ්‍යාව 1993 දී දශලක්ෂ 486 සිට 1994 දී දශලක්ෂ 517 දක්වා සියයට 6 කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ දේශීය තැපැල් මෙහෙයුම් කටයුතු 1994 වසර තුළ දශලක්ෂ 449 දක්වා සියයට 9 කින් වැඩිවීමයි. මීට ප්‍රතිවිරුද්ධව විදේශීය තැපැල් මෙහෙයුම් කටයුතු සියයට 6 කින් අඩුවී දශලක්ෂ 67 ක් විය. 1993 සහ 1994 දෙවසර තුළදී විදේශිය පාර්සල් මෙහෙයුම් සියයට 7 කින් වැඩිවී 74,000 ක් වූ අතර, දේශීය පාර්සල් මෙහෙයුම් 1994 දි 5,79,000 දක්වා සුළු වශයෙන් අඩු විය. දිවයිනේ තැපැල් කාර්යාල පද්ධතිය 1993 දි පැවැති සංඛ්‍යාව වූ 4,042 සිට 1994 දී 4,105 දක්වා පුළුල් විය. එක් තැපැල් කාර්යාලයකින් සේවාව සැපයුන ප්‍රදේශය 1993 දී වර්ග කිලෝමීටර් 16.2 සිට 1994 දී වර්ග කිලෝමීටර් 16.0 දක්වා සුළු ප්‍රමාණයකින් අඩු වෙමින් මහජනතාවට සපයා ඇති තැපැල් පහසුකම් වැඩිවී ඇති බව පෙන්නුම් කෙරිණි. වසර දෙක අතරතුරදී එක් පුද්ගලයෙකුට ලැබෙන ලිපි සාමාන්‍ය සංඛ්‍යාව ඉතා සුළු වශයෙන් පමණක් වැඩි වූ අතර එමගින් ජනතාව වඩා සීඝ්‍ර පණිවුඩ හුවමාරු ක්‍රම භාවිතය කෙරෙහි නැඹුරු වී ඇති බව පෙන්නුම් කළේය.

විදුලි සංදේශ අංශය එහි ධාරිතාව සහ ජනතාවට සලසන ලද සේවාවන් අනුව ප්‍රමාණවත් වර්ධනයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකා ටෙලිකොමේ (ශ්‍රී. ලං. ටෙ.) විසින් දැනට පවත්නා විදුලි සංදේශ පද්ධතිය පුළුල් කිරීමට සහ වැඩි දියුණු කිරීම පිණිස සංවර්ධන ව්‍යාපෘතීන් කිපයක් ක්‍රියාත්මක කරන ලදි. මේ වසර තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් වූයේ ජාත්‍යන්තර පද්ධති සංවර්ධනය කිරීම, ප්‍රධාන හුවමාරු පද්ධතිය, කොළඹ සහ එහි අවට ප්‍රදේශයන්හි හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීම සහ පිහිටුවීම, මහ කොළඹ ආර්ථික බල ප්‍රදේශයේ පණිවුඩ හුවමාරු පද්ධතිය වැඩි දියුණු කිරීමේ දෙවැනි අදියර, ගම්පහ සහ කටුනායක හුවමාරු පොලආශ්‍රිත ප්‍රදේශයන්හි විදුලි සංදේශ පද්ධතිය දියුණු කිරීම, මාතර දිස්ත්‍රික්කයේ විදුලි සංදේශ පද්ධතිය වැඩි දියුණු කිරීම, අග්නිදිග ආසියානු මැද පෙරදිග සහ බටහිර යුරෝපා සබ්මැරීන් සංදාම යෝජනා ක්‍රමය (සී.මී. ඩී.2) සහ "පොදු ස්විච් ගත දත්ත සැකසුම් කිරීමේ පද්ධතිය" ආදියයි. ලෝක බැංකුව මගින් ආධාර සපයන ලද කොළඹ සහ අවට ප්‍රදේශයන්හි හුවමාරු මධ්‍යස්ථාන සැපයීම සහ පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ විමසුමට ලක් වන වර්ෂය තුළදී සම්බන්ධතා මාර්ග 14,800 ක් දැනට පවතින ස්විච් පද්ධතියට එක් කරන ලදී.

**1.33 සංඛ්‍යා සටහන**

**තැපැල් හා විදුලි සංදේශ සේවාවේ වර්ධනය 1990 - 1994**

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994* |
|---|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | | |
| 1.1 තැපැල් බෙදීමේ කොට්ඨාශ ගණන | 6,636 | 6,729 | 6,729 | 6,729 | 6,729 |
| 1.2 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (ව. කි. මී.) | 16.6 | 16.5 | 16.3 | 16.2 | 16.0 |
| 1.3 තැපැල් කාර්යාල සංඛ්‍යාව | 3,945 | 3,982 | 4,018 | 4,042 | 4,105 |
| 1.3.1 රාජ්‍ය අංශය | 3,864 | 3,884 | 3,891 | 3,895 | 3,932 |
| 1.3.2 පෞද්ගලික අංශය | 81 | 98 | 127 | 147 | 173 |
| 1.4 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව | 4,307 | 4,331 | 4,332 | 4,359 | 4,352 |
| 1.5 එක් පදිංචිකරුවකුට ලැබුණු ලිපි ගණන | 31 | 29 | 27 | 28 | 29 |
| 2. විදුලි සංදේශ සේවය | | | | | |
| 2.1.1 දුරකථන සේවය | 1,21,388 | 1,25,834 | 1,35,504 | 1,57,774 | 1,80,724 |
| 2.1.2 අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව | 10,241 | 6,579 | 10,607 | 22,270 | 25,322 |
| 2.1.3 පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 47,945 | 61,313 | 96,207 | 1,24,066 | 1,86,245 |
| 2.1.4 දුරකථන සඳහා ඉල්ලුම (සංඛ්‍යාව) | 1,69,333 | 1,87,147 | 2,31,711 | 2,81,840 | 3,66,969 |
| 2.1.5 දුරකථන ඝණත්වය (පුද්ගලයින් 100 කට දුරකථන ගණන) | 0.71 | 0.73 | 0.78 | 0.90 | 1.01 |
| 2.2 විදේශ විදුලි සංදේශ සේවය | | | | | |
| 2.2.1 ටෙලෙක්ස් සම්බන්ධක ගණන | 1,666 | 1,740 | 1,583 | 1,626 | 1,685 |
| 2.2.2 පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 89 | 84 | 103 | 59 | 34 |
| 2.2.3 එතෙර ඇමතුම් (සංඛ්‍යාව) | | | | | |
| 2.2.3.1 එතෙර දුරකථන ඇමතුම් සංඛ්‍යාව (අ) | 90,06,000 | 1,55,99,912 | 17,7,75,066 | 1,99,00,000 | 2,16,00,000 |
| 2.2.3.2 එතෙර විදුලි පණිවුඩ (ආ) | 27,20,000 | 24,65,682 | 24,83,002 | 22,20,000 | 22,30,000 |
| 2.2.3.3 එතෙර ටෙලෙක්ස් පණිවුඩ (අ) | 44,72,122 | 43,46,467 | 42,30,994 | 33,00,000 | 31,00,000 |

* තාවකාලික.

(අ) සංඛ්‍යා දැක්වෙන්නේ මිනිත්තු වලිනි

(ආ) සංඛ්‍යා දැක්වෙන්නේ වචන වලිනි.

මූලයන් : තැපැල් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ටෙලිකොම්.

1993 දී සියයට 22 කින් වැඩි වූ දුරකථන සඳහා වූ ඉල්ලුම 1994 දී සියයට 30 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. විදුලි සංදේශ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩි දියුණු වීමත් සමගම 1994 දී සපයන ලද දුරකථන සංඛ්‍යාව 25,322 කින් වැඩි වී 1,80,724 ක් විය. මේ හේතුවෙන් වසර දෙක තුළදී දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 දෙනෙක් සඳහා දුරකථන) 0.90 සිට 1.01 දක්වා වැඩි විය. කෙසේ වෙතත් සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවත්නා දුරකථන ඉල්ලුම සපුරාලීමට දැනට පවතින විදුලි සංදේශ පද්ධතිය අපොහොසත්වීම පිළිබිඹු කරමින් පොරොත්තු ලේඛයේ සිටින අයදුම්කරුවන් ප්‍රමාණය 62,179 කින් වැඩි වී 1994 වර්ෂය අවසාන වන විට 1,86,245 ක් විය. මේ අනුව ශ්‍රී. ලං.ටෙ. ආයතනයට රටෙහි දුරකථන සඳහා වූ ඉල්ලුමෙන් සියයට 49 ක් පමණක් සපුරාලීමට හැකි විය. සෙලියුලර් පණිවුඩ පහසුකම් වැඩිවීම මගින් සීඝ්‍රයෙන් වැඩිවන දුරකථන ඉල්ලුම තරමක් දුරට සමනය කර ගැනීමට හැකි විය. " ස්ථාපිත කිරීම ක්‍රියා කරවීම සහ පැවරීම" යන පදනම යටතේ ක්‍රියාත්මක වූ මොබිටෙල් සෙලියුලර් මොබයිල් පද්ධතියට 1994 වසර අවසාන වන විට දුරකථන 10,000 ක් සැපයීමට හැකි වී ඇත. මෙම නව දුරකථන ක්‍රමය මගින් අනුරාධපුර, රත්නපුර, කුරුණෑගල, කුලියාපිටිය, හලාවත, මීගමුව, ජා-ඇල, කොළඹ, මාතර, කළුතර, ගාල්ල මොරටුව සහ මහනුවර යන ප්‍රදේශ ආවරණය වේ. මේ අතර, ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් 1994 වසරේදී මහජනතාවට හඳුන්වා දෙන ලද අමතර නව සේවාන් කීපයක් එනම් පොරොත්තු ඇමතුම් ඇමතුම් මාරුකිරීම්, කෙටි අංක ගැනිම් , සාමූහික සන්නිවේදන ඇමතුම් ආදිය හඳුන්වා දෙන ලදී.

1994 වසර තුළදී ටෙලෙක්ස් පණිවුඩ සම්බන්ධතා සංඛ්‍යාව 59 කින් වැඩි වී 1,685 දක්වා විය. විමසුමට ලක් වන වසර තුළ එතෙර දුරකථන ඇමතීම් සියයට 9 කින් වැඩි වූ අතර, එතෙර විදුලි පණිවුඩ ඉතා සුළු වැඩිවීමක් පෙන්නුම් කළේය. එතෙර ටෙලෙක්ස් පණිවුඩ 1994 දී සියයට 6 කින් අඩු විය.

## ජනසවිය වැඩ පිළිවෙල

1994 වර්ෂයේදී ජනසවිය වැඩසටහනේ කටයුතු එහි සිව්වන වටය, පස්වැනි වටය සහ තෙවැනි වටයෙන් ඉතිරි වූ තවත් පවුල් සංඛ්‍යාවකට සේවය සැලසීම කෙරේ වැඩි අවධානයක් යොමු කරමින් ක්‍රියාත්මක විණි. ජනසවිය සිව්වන වටය යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 25 ක් තුළ පවුල් 1,00,816 ක් ආවරණය කරන ලදී. 1994 ජුනි මාසයෙන් පසු ආරම්භ වූ පස්වන වටයේ කටයුතුත් සමඟ තවත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 26 ක පවුල් 1,19,548 කට සහන සලසමින් වැඩසටහන තවදුරටත් පුළුල් කරන ලදි. ජනසවිය වැඩසටහනේ තෙවන වටයෙන් ඉතිරිවූ තවත් පවුල් 19,208 කට ද වසර තුළ දි සහන සැපයුනි. මේ අනුව වර්ෂය තුළදී ජනසවිය වැඩසටහන මගින් පරිභෝජන ආධාර ප්‍රතිලාභ හිමි වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව 2,38,572 ක් ලෙස ගණන් බලා ඇත. තවද, ජනසවිය වැඩසටහනේ ප්‍රථම වට දෙක සම්පූර්ණ කළ පවුල් 2,51,677 කට ජනසවිය ප්‍රාග්ධන හිමිකම් සහතික පත්‍ර ක්‍රමය යටතේ සිය ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි විය.

වර්ෂය තුළදී ජනසවිලාභීන්ට පරිභෝජන ආධාර සැපයිම වෙනුවෙන් වැයවූ මුළු වියදම රුපියල් දශලක්ෂ 2,863 ක් ලෙස ගණන් බලා ඇත. 1994 වර්ෂයේ දී ජනසවිලාභීන්ගේ ඉතුරුම් වෙනුවෙන් යෙදවුණු පිරිවැය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,311 ක් විය. තවද ප්‍රථම හා දෙවන වට යටතේ ප්‍රාග්ධන හිමිකම් සහතික පත්‍ර හිමි වූ ජනසවිලාභීන් 2,51,677 දෙනෙකුට පොළිය ගෙවීම සඳහා රුපියල් දශලක්ෂ 755 ක් වැය කරන ලදි. ඒ අනුව තෙවැනි, සිව්වැනි සහ පස්වැනි වට ක්‍රියාත්මක කිරීම සඳහාත්, ප්‍රාග්ධන හිමිකම් සහතික පත්‍ර ලාභීන්ට පොලී ගෙවීම සඳහාත් වර්ෂය තුළදී කරන ලද මුළු වියදම රුපියල් දශලක්ෂ 4,929 ක් විය.

වර්ෂයේ ප්‍රථම භාගය තුලදී තෙවැනි හා සිව්වැනි වටයේ ජනසවිලාභින්ට සිය ස්වයං රැකියා ව්‍යාපෘතිය හා ආදයම් උපයා ගැනීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා ලැබූ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 270 ක් විය. මෙම ණය පහසුකම් ප්‍රදානය කරන ලද්දේ ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හා සමූපකාර ග්‍රාමීය බැංකු සහ ජනශක්ති බැංකුව මගිනි.

පසුගිය වර්ෂයේ මෙන්ම ජනසවිය භාරකාර අරමුදල (ජ.භා.අ) ජනතාවගේ ආර්ථික හැකියාවන් වැඩි දියුණු කිරීම හා දිවයිනේ දුෂ්කර ප්‍රදේශවල ජනතාවගේ පෝෂණ තත්ත්වය නගා සිටුවීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ජනසවිය භාරකාර අරමුදල ස්වකීය ප්‍රධාන ව්‍යාපෘතීන් හතර වන ජන සමූහ ව්‍යාපෘති, මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘති, ණය ව්‍යාපෘති සහ පෝෂණ ව්‍යාපෘති යටතේ වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 605 ක් උපයෝගී කර ගන්නා ලදී. ඊට අමතරව ජනසවි භාරකාර අරමුදල මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා රාජ්‍ය නොවන සංවිධාන (රා.නො.ස.) වල සහභාගීත්වයේ වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. වසර අවසානයේදී ජනසවි භාරකාර අරමුදලේ මඟපෙන්වීම යටතේ ග්‍රාමීය පොදු පහසුකම් ව්‍යාපෘති 2,029 ක් ,සූක්ෂම ව්‍යවසාය හා ස්වයං රැකියා ව්‍යාපෘති 38,868 ක්, පෝෂණ ව්‍යාපෘති සහ සමාජීය සංචලනය වැඩසටහන් 324 ක් ක්‍රියාත්මක කරනු ලැබිණ.

## සමෘද්ධි ව්‍යාපාරය

දිළිඳුකම පිටුදැකීමේ හා ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් "සමෘද්ධි ව්‍යාපාරය" නමින් නව වැඩසටහනක් දියත් කිරීමට රජය පියවර ගෙන ඇත. මෙම වැඩපිළිවෙලෙහි මූලික සංකල්පය වනුයේ දිළිඳුකම තුරන් කිරීම පවුල් ඒකකයකින් පටන් ගෙන ජාතික මට්ටම දක්වා පුළුල් කිරීමයි. මෙම අරමුණ කරා ලඟා විය හැක්කේ දිළිඳු ජන කොටස් රටේ ආර්ථික හා සමාජ සංවර්ධන කටයුතු සමඟ ඒකාබද්ධ කිරීමෙන් ඔවුන්ගේ ඉහළ ආදායම් හා සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම තුළිනි. මෙහිදී, පවුල් මට්ටමේ පවත්නා ආර්ථික කටයුතු, ග්‍රාමීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ඇති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සමඟ සම්බන්ධ විය යුතුය. යෝජිත සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමග දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජනසවිය වැඩසටහන, ආහාර මුද්දර සහ දිවා ආහාර වැඩසටහන වැනි දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් අහෝසි වනු ඇත.

1995 වර්ෂයේ මැද භාගයේදී පමණ දියත් කිරීමට අපේක්ෂා කරන සමෘද්ධි ව්‍යාපාරය මගින් රටේ ජනගහනයෙන් තුනෙන් එකක් පමණ ආවරණය කරනු ලබයි.එමගින් පහළම මට්ටමේ ආදායම් ලබන කොටස් ලෙස සැලකෙන පවුල් දශලක්ෂ 1.2 කට ප්‍රතිලාභ අත්කර දෙනු ඇත. මෙම ව්‍යාපාරය යටතට ගැනෙන මුළු සංඛ්‍යාවෙන් පවුල් ලක්ෂයකගේ මාසික ආදායම, රුපියල් 1,500 දක්වා වැඩි කිරීම සඳහා මසකට රුපියල් 1,000 ක සෘජු ආදායම් දීමනාවක් සැපයීමට අපේක්ෂා කෙරේ. මසකට රුපියල් දහසක සාමාන්‍ය මාසික ආදායමක් උපයන ඉතිරි පවුල් දශලක්ෂ 1.1 සඳහා මසකට රුපියල් 500 ක ආදායම් සහනයක් මුදලින් ගෙවනු ලැබේ. මේ අනුව වැඩසටහනෙහි අභිප්‍රාය වනුයේ දුගී පවුල්වල මාසික ආදායම රුපියල් 1,500 ක මට්ටමකට නංවාලීමයි. තවද, සමෘද්ධි වැඩසටහනෙහි ස්වයං රැකියා කටයුතු මගින් ලැබෙන අතිරේක ආදායම් ඉහළ යාමත් සමඟ මෙම ආදායම මසකට රුපියල් 2,000 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සමෘද්ධි ව්‍යාපාරයෙහි එක් ප්‍රධාන අරමුණක් වනුයේ, ඉතිරිකිරීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම සහ ස්වයං රැකියා ආදායම් ඉපැයීම් වර්ධනය කිරීම මගින් ස්වෝත්සාහයෙන් නැගී සිටීමට දිරි දීමයි. අරපිරිමැස්ම හා ඉතිරිකිරීමේ පුරුද්ද වර්ධනය කිරීම සඳහා අන්ත දිළිඳු අයගේ සහන මුදලින් මසකට රුපියල් 200 ක් සහ අනෙකුත් කොටස් වලින් මසකට රුපියල් 100 බැගින් ඉතිරි කරන ලෙසට සියළුම සමෘද්ධිලාභීන් දිරිමත් කරනු ලැබේ. මෙම ඉතුරුම් සහ බාහිරව ලබා ගන්නා අතිරේක මුදල් සමෘද්ධිලාභීන් අතර නව ආදායම් ඉපැයීමේ කටයුතු මූල්‍යනය කිරීමට යොදා ගනු ලැබේ. මේ අතර, චිරස්ථායි හා ලාභදායී ආයෝජන මාර්ග සකස් තරගත් සමෘද්ධිලාභීන්ට, වසර දෙකක සමෘද්ධි දීමනාව ව්‍යාපාරයේ මූලධනය ලෙස යෙදවීමට අවස්ථාව ලබාදෙන අතර, මෙය රුපියල් 25,000 සිට රුපියල් 50,000 දක්වා වූ ආයෝජනයක් සඳහා යොදගත හැක. මෙවැනි ප්‍රාග්ධන පහසුකමක් මේ හා සමාන ණය මුදලකින් ද ප්‍රතිපූරණය කළ හැකි වන පරිදි ඉඩ ප්‍රස්ථා සලසා දීමට වැඩසටහන බලාපොරොත්තු වේ.

සමෘද්ධිලාභියෙකුගේ මාසික ආදායම රුපියල් 2,000 ඉක්මවමින් මාස හයක් අඛණ්ඩව පැවතියහොත් හෝ පවුලේ එක් අයෙකුට රැකියාවක් ලැබුණහොත් එම පවුල වැඩසටහනින් ඉවත් කරනු ලැබේ. මෙවැනි සමෘද්ධිලාභීන් වැඩසටහනින් ඉවත් කිරීමත් සමඟ නව ප්‍රවේශකයන්ට ද ව්‍යාපාරයට සම්බන්ධවීමට හැකියාව ලැබේ.

සමෘද්ධි වැඩසටහනෙහි පරිපාලන ව්‍යුහය සකස් විය යුත්තේ කිසියම් කේන්ද්‍රස්ථානයක සිට පුළුල් ප්‍රදේශයක් දක්වා පහලට විහිද යන ලෙසින් දිළිඳු සහ ආර්ථික තත්ත්වය නංවාලීමේ අවශ්‍යතාවය ඇති පවුල් ඒකකයන් කරා ළඟා විය හැකි පරිදිය. මේ අරමුණින් රජය විසින් "සමෘද්ධි අධිකාරියක්" පිහිටවනු ලැබේ. එය සමෘද්ධි ව්‍යාපාරයේ විධායක හා පරිපාලන අංශයයි. සමෘද්ධි ව්‍යාපාරයේ කටයුතු, දිස්ත්‍රික් සමෘද්ධි කමිටු මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. සමෘද්ධි ජාතික වැඩසටහන මෙන්ම දිළිඳු බව පිටුදැකීමේ අනෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව සුපරීක්ෂණය කිරීම දිස්ත්‍රික් සමෘද්ධි කමිටුවල වගකීම වේ. සමෘද්ධි ව්‍යාපාර යට කොමසාරිස් ජෙනරාල්වරයකු පත් කෙරෙනු ඇත. එමෙන්ම රැකියා විරහිත අ. පො. ස. සාමාන්‍ය පෙළ සුදුසුකම් ලත් තරුණයන් 40,000 ක් "සමෘද්ධි නියාමක" වරුන් ලෙස තෝරාගනු ලබයි. මෙම නියාමකවරුන් විසින් ගම් මට්ටමේ සමෘද්ධිලාභීන් හඳුනා ගැනීම පිණිස පවුල් තත්ත්වය පිළිබිඹු කෙරෙන සහභාගිත්ව සමීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තු වේ. මෙම සමීක්ෂණය පවුලේ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඔවුනගේ විභව හැකියාවන්, ශිල්පිය ඥානය සහ ඔවුන් සතු සම්පත් අනුව එක් එක් පවුල් සඳහා වූ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙල සැකසීමට උපකාරි වනු ඇත.

## සෞඛ්‍ය

1994 වසර තුලදී සෞඛ්‍ය සේවාවන් සඳහා රජයේ මුළු වියදමින් සියයට 5 ක් හෙවත් රුපියල් දශලක්ෂ 9,185ක් වියදම් කර ඇත. මෙය පසුගිය වසර සමග සසඳා බලන කල සියයට 30 ක වැඩිවීමකි. සාපේක්ෂ වශයෙන් එය දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් වශයෙන් 1993

1.34 සංඛ්‍යා සටහන

**සෞඛ්‍ය සේවය 1990 - 1994**

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994* |
|---|---|---|---|---|---|
| 1. ආරෝග්‍යශාලා (බටහිර වෛද්‍ය සේවය | 502 (ආ) | 504 (ආ) | 506 | 504 | ලැ.නො. |
| 2. ඇඳන් ගණන | 42,079 (ආ) | 42,437 (ආ) | 48,061 | 48,949 | ලැ.නො. |
| 3. මධ්‍යම බෙහෙත් ශාලා | 278 (අ) | 275 | 350 | 365 | ලැ.නො. |
| 4. මුළු වෛද්‍යවරු සංඛ්‍යාව | 2.440 (අ) | 2,934 | 3,345 | 3,713 | 3,967 |
| 5. මුළු සහකාර වෛද්‍යවරු සංඛ්‍යාව | 1,074 | 1,201 | 1,253 | 1,305 | 1,298 |
| 6. මුළු ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව | 13,248 (අ) | 12,852 | 13,131 | 13,454 | 13,562 |
| 7. මුළු හෙද සේවක සංඛ්‍යාව | 8,957 | 9,934 | 11,214 | 11,818 | 13,142 |
| 8. මුළු උපස්ථායක සංඛ්‍යාව | 5,707 (ආ) | 5,697 (ආ) | 5,710 | 5,772 | 5,469 |
| 9. ප්‍රතිකාරලත් අභ්‍යන්තර රෝගීන් සංඛ්‍යාව | 2,533 (ආ) | 2,629 (ආ) | 3,023 | 3,174 | ලැ.නො. |
| 10. බාහිර රෝගීන් සංඛ්‍යාව | 28,401 | 28,575 | 36,827 | 36,892 | ලැ.නො. |
| 11. මුළු සෞඛ්‍ය වියදම (රු. දශලක්ෂ) | 4,964 | 5,229 | 6,541 | 7,064 | 9,185 |
| (අ) ජංගම වියදම (රු. දශලක්ෂ) | 3,685 | 4,110 | 4,518 | 5,711 | 7,666 |
| (ආ) ප්‍රාග්ධන වියදම (රු.දශලක්ෂ) | 1,279 | 1,119 | 2,023 | 1,353 | 1,519 |

* තාවකාලික.
(අ) උතුරු පලාත ඇතුලත් නැත.
(ආ) උතුර පලාත නැගෙනහිර පලාත් ඇතුලත් නැත.

මූලයන් : සෞඛ්‍ය මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දී සියයට 1.4 සිට 1994 දි සියයට1.6 දක්වා වැඩි විය. 1994 දී සෞඛ්‍ය සඳහා වූ වර්තන වියදම සියයට 34 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 7,666 ක් වූ අතර ප්‍රාග්ධන වියදම සියයට 12 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,519 ක් විය. මේ අතර රෝග නිවාරණය කිරීමේ සහ රෝග වැලැක්වීමේ සේවාවන් වල නිරත වුනු වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව 1993 දී පුද්ගලයින් 100,000 කට 21 සිට 1994 දී පුද්ගලයන් 100,000 කට 22 දක්වා සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. හෙදියන්ගේ සංඛ්‍යාව පුද්ගලයන් 100,000 කට 67 සිට 74 දක්වා වැඩිවිය.

පසුගිය වසරේ මෙන් 1994 දී ද සෞඛ්‍ය ප්‍රතිපත්තියෙහි මූලික අරමුණු වූයේ ජනතාවගේ සෞඛ්‍ය කටයුතු නංවාලීම, රෝග වැලැක්වීම හා මර්ධනය සහ පවත්නා සේවාවන්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම විය. විමසුමට ලක්වන වසර තුල සෞඛ්‍ය ප්‍රතිපත්තීන් අවධානය යොමු කරනු ලැබුවේ ප්‍රමාණවත් සේවාවන් නොලැබුණ ප්‍රදේශවලට සහ පහසුකම් අඩු මට්ටමකින් ලබන ජනතාවට සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහාය. මේ අතර රෝගීන්ට අවශ්‍ය පහසුකම් වැඩි කිරීමට හා ප්‍රජා සෞඛ්‍ය සේවා කටයුතු වැඩිදියුණු කිරීමේ අභිලාෂයෙන් යුතුව පොදු සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට විදේශී ය ආධාර සහිත විශේෂ ව්‍යාපෘති ගනනාවක් 1994 වර්ෂය තුල ක්‍රියාත්මක විය. වර්ෂය තුල විදේශ ආධාර ඇතිව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට ඇතුලත් වූයේ ආසියානු සංවර්ධන බැංකු සහාය ඇතිව ක්‍රියාත්මක වූ දෙවන සෞඛ්‍ය ජනගහන් ව්‍යාපෘතිය, ලෝක බැංකුව / ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් අරමුදල් සපයනු ලැබූ සෞඛ්‍ය සහ පවුල් සංවිධාන ව්‍යාපෘතිය, ෆිනීඩා මගින් අරමුදල් සපයනු ලැබූ කොළඹ මහ රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ චීන ආණ්ඩුව මගින් අරමුදල් සපයනු ලැබූ රිජ්වේ ළමා රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියයි.

ප්‍රජා සෞඛ්‍ය සේවාවන් දියුණු කිරීමේ වැඩ සටහන තුලින් බෝවන රෝග පැතිරීම වැලැක්වීම, සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම, වසංගත රෝග බෝවීම වැලැක්වීම සහ පවුල් සෞඛ්‍ය දියුණු කිරීම ආදිය 1994 වර්ෂය තුලදී නොකඩවා ක්‍රියාත්මක විය. ජැපනීස් එන්සෙපලයිටීස් සහ ඩෙංගු රක්තපාත උණ වැනි රෝග පැතිරීම 1994 වසර තුලදී පහත වැටුනි. ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් අනුමත කරන ලද ලෝක මැලේරියා මර්ධන ව්‍යාපාරයේ ක්‍රියා පිළිවෙතට ගැලපෙන පරිදි මැලේරියා මර්ධන ව්‍යාපාරයට නව මුහුණුවරක් දෙන ලදි. 1994 වර්ෂය තුල මැලේරියා මර්ධන කටයුතු ක්‍රියාත්මක වූයේ නිවාස තුල ක්‍රමානුකූලව බෙහෙත් ඉසීම, රෝග කල්තියා සොයා ගැනීමේ ක්‍රම ශක්තිමත් කිරීම, රසායනික ද්‍රව්‍ය ගැල්වූ මදුරු දැල් පාවිච්චිය වැනි ස්ව ආරක්ෂක ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් වැඩිදියුණු කිරීමෙන්ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මැලේරියා රෝගීන් සංඛ්‍යාව 1993 වසරේදී වාර්තා වූ 3,63,197 සිට 1994 දී 2,59,221 දක්වා සැලකිය යුතු ලෙස අඩුවිය.

## අධ්‍යාපනය

1994 වර්ෂයේදී අධ්‍යාපන කටයුතු සඳහා රජයේ මුළු වියදමෙන් සියයට 11 ක් නැතහොත් රුපියල් බිලියන 18 ක් වැයකර ඇත. මෙය පසුගිය වර්ෂයේ වැයකළ මුදල් ප්‍රමාණයට වඩා සියයට 26 ක ඉහළයාමකි. අධ්‍යාපන කටයුතු සඳහා වූ වියදම 1993 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.8 සිට 1994 දී සියයට 3.1දක්වා ඉහළ ගීය අතර විමසුමට අදළ වර්ෂයේදී අධ්‍යාපන කටයුතු සඳහා වූ ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 2,877 දක්වා සියයට 1 කින් ඉහළ ගියේය. අධ්‍යාපනය සඳහා වූ වර්තන වියදම් ද රුපියල් දශලක්ෂ 14,836 දක්වා සියයට 32 කින් ඉහළ ගියේය. දිවා ආහාර වැඩපිළිවෙල, පාසැල් පොත් ලබාදීම, පාසැල් වාර ප්‍රවේශපත් ලබාදීම සහ නොමිලයේ පාසැල් නිළ ඇඳුම් සැපයීම සඳහා වැයකළ රුපියල් දශලක්ෂ 3,594 ක මුදලද මෙයට ඇතුලත් වි ඇත. 1994 දී පාසැල් 10,760ක දශලක්ෂ 4.3 ක පාසැල් සිසුන්ට මෙම වැඩපිළිවෙල යටතේ ප්‍රතිලාභ ලබා දී ඇත.

1993 දි 10,710 ක්ව තිබූ මුළු පාසැල් සංඛ්‍යාව1994 දී 10,760 දක්වා වැඩිවිය. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවද 1993 දී 43,03,493 සිට 1994 දී 43,12,508 දක්වා වැඩිවිය. මේ අනුව, එක් පාසැලකට අයත් ශිෂ්‍ය සංඛ්‍යාව 1993 දී 402 සිට 1994 දී 401 දක්වා අඩුවිය. මේ අතර, විමසුමට අදළ වර්ෂයේදී අධ්‍යාපන සේවය සඳහා ගුරුවරු 2,645 ක් අනුයුක්ත කර ගැනීමෙන් මුළු ගුරුවරු සංඛ්‍යාව 1,95,243 ක් දක්වා වැඩිවිය. මේ හේතුවෙන් ගුරු සිසු අනුපාතය 1993 දී 22.3 සිට

1.35 සංඛ්‍යා සටහන

**සාමාන්‍ය අධ්‍යාපනය 1990 -1994**

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994* |
|---|---|---|---|---|---|
| .1. මුළු පාසැල් සංඛ්‍යාව | 10,382 | 10,520 | 10,588 | 10,710 | 10,760 |
| 1.1 රජයේ මුළු පාසැල් සංඛ්‍යාව | 9,864 | 9,998 | 10,042 | 10,160 | 10,193 |
| 1.2 වෙනත් පාසැල් | 518 | 522 | 546 | 550 | 567 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 42,32,356 | 42,58,697 | 42,86,275 | 43,03,493 | 43,12,508 |
| 2.1 රජයේ පාසැල් | 41,11,272 | 41,35,114 | 41,56,254 | 41,72,897 | 41,97,642 |
| 2.2 වෙනත් පාසැල් | 121,084 | 1,23,583 | 1,30,021 | 130,596 | 1,14,866 |
| 3. අළුතෙන් ඇතුලත් කර ගැනීම් | 387,314 | 3,88,315 | 3,59,003 | 3,54,390 | 3,39,006 |
| 4 මුළු ගුරුවරු සංඛ්‍යාව | 1,84,822 | 1,77,231 | 1,82,756 | 1,93,924 | 1,95,243 |
| 4.1 රජයේ ගුරුවරු | 1,78,333 | 1,70,735 | 1,75,813 | 1,86,926 | 1,87,937 |
| 4.2 වෙනත් | 6,489 | 6,496 | 6,943 | 6,998 | 7,306 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | 22.9 | 24.0 | 23.5 | 22.2 | 22.1 |
| 6. අධ්‍යාපනය සඳහා වූ මුළු වියදම (රු. දශලක්ෂ) (අ) | 9,571 | 9,129 | 12,541 | 14,070 | 17,713 |
| 6.1 වර්තන | 8,529 | 7,951 | 10,533 | 11,225 | 14,836 |
| 6.2 ප්‍රාග්ධන | 1,042 | 1,178 | 2,008 | 2,845 | 2,877 |

* තාවකාලික.
(අ) උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම ද ඇතුළුව.

මූලයන්: අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව

1994 වසරේදී 22.1 දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් අඩුවිය. අධ්‍යාපන සේවය ක්‍රමවත් කිරීම පිණිස " ගුරු අධ්‍යාපන සේවය" 1994 දී පිහිටුවනු ලැබීය.

1994 වර්ෂය තුළදී ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන යටිතල පහසුකම් නැංවීම සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබීය. 1994 වර්ෂයේදී ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන යටිතල පහසුකම් පුළුල් කිරීම පිණිස, විදේශීය මූල්‍ය ආධාර සහිතව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් වූයේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය, සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය, ප්‍රාථමික පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය, වතුකරයේ පාසැල් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය සහ ජර්මන් කාර්මික සහයෝගිතා ව්‍යාපෘතියයි. ජාතික පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1994 වර්ෂය අවසානයේදී පාසැල් 160 ක් ජාතික පාසැල් තත්ත්වයට උසස් කරතිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් එක් මැතිවරණ දිස්ත්‍රික්කයකට අඩුම වශයෙන් සියළුම පහසුකම් සහිත එක් පාසැලක්වත් පිහිටුවීමට අපේක්ෂා කෙරේ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැන සළකා බලන කල 1988 සහ 1989 යන දෙවසර තුළදී විශ්වවිද්‍යාල වසා තැබීමේ හේතුවෙන් ප්‍රමාද වූ 1992/93 අධ්‍යයන වසර, 1994 දී ආරම්භ විය. විමසුමට අදළ වසරේදී සිසුන් 8,540 ක් විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ අතර, සිසුන් 5,368 ක් උපාධිධාරීන් බවට පත් විය. අළුතින් ඇතුලත් වූ සිසුන්ගෙන් කලා , වාණිජ සහ කළමණාකරණ අංශවලට අයත් ශිෂ්‍ය සංඛ්‍යාව 4,369 ක් වූ අතර, විද්‍යා, ඉංජිනේරු සහ වෛද්‍ය අංශවලට බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 3,370 ක් විය. 1994 වර්ෂය අවසානයේදී ප්‍රධාන විශ්වවිද්‍යාල නමයෙහි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 30,764 ක් විය. කෙසේවෙතත්, විශ්ව විද්‍යාල නමයේම අධ්‍යයන කාර්ය මණ්ඩලය 1993 දී 2,090 සිට 1994 දි 2,319 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ හේතුවෙන් ගුරු සිසු අනුපාතය 1993 දි 15 සිට 1994 දී 13 දක්වා යහපත් අතට හැරුනි. 1994 වසරේදී විවෘත විශ්ව

විද්‍යාලයට නවක සිසුන් 11,314 ක් ඇතුලත් කර ගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 1994 වසර අවසානයේදී විවෘත විශ්වවිද්‍යාලයෙහි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 20,022 ක් විය. විවෘත විශ්ව විද්‍යාලයෙහි ආචාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 1993 දී 355 සිට 1994 දි 382 දක්වා ඉහළ ගියේය.

## මහවැලි වැඩපිළිවෙල

1994 වර්ෂය තුලදී ද මහවැලි බල ප්‍රදේශය තුල ගොවි සහ ගොවි නොවන පවුල් ලියාපදිංචි කිරීමේ කාර්යය පෙර පරිදිම සිදුවිය. 1993 වර්ෂයේ මහවැලි වැඩපිළිවෙල සඳහා දරණ ලද මුළු පිරිවැය රුපියල් දශලක්ෂ 2,642 ක සමඟ සසඳන කළ 1994 දී මෙය රුපියල් දශලක්ෂ 1,888 ක් විය. 1994 වර්ෂය සඳහා වෙන් කරණ ලද මුළු මුදලින් සියයට 96 කට සමාන ප්‍රමාණයක් වර්ෂය තුලදීම වියදම් කරණ ලදී. වියදම් කරණ ලද මුළු මුදලින් රුපියල් දශලක්ෂ 1,156 ක් හෙවත් සියයට 61 ක් කලාපීය සංවර්ධන වැඩකටයුතු සඳහා "බී" කලාපයට (රුපියල් දශලක්ෂ 528), "සී" කලාපයට (රුපියල් දශලක්ෂ 376), "එච්" කලාපයට (රුපියල් දශලක්ෂ 95) ක් සහ "එල්" කලාපයට (රුපියල් දශලක්ෂ 157) වැය කර තිබුණි.

මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන විදුලි බලාගාර වලින් උත්පාදනය කරණ ලද මුළු විදුලිබල ප්‍රමාණය 1993 වර්ෂයේදී සියයට 22 කින් වැඩි වූ අතර, එය 1994 වර්ෂයේදී තවදුරටත් සියයට 16 කින් වැඩි වී ගිගවොට් පැය 2,207 ක් විය. මෙම වැඩිවීමට හේතු වූයේ විදුලි බලාගාර ආශ්‍රිත ප්‍රදේශවල පැවැති යහපත් කාලගුණික තත්ත්වයයි. 1993 වර්ෂයේදී නඩත්තු කටයුතු සඳහා වසාතබන ලද බෝවතැන්න ජල විදුලි බලාගාරය 1994 අප්‍රේල් මාසයේදී නැවත විවෘත කරණ ලද අතර ගිගවොට් පැය 38 ක් උත්පාදනය කරන ලදී. පසුගිය වර්ෂයේ සියළු ජල විදුලි බලාගාරවල ක්‍රියාකාරිත්වය සමග සසඳන කල උකුවෙල හැර අනිකුත් විදුලි බලාගාරවල ක්‍රියාකාරීත්වය උසස් මට්ටමක පැවතුණි. 1993 වර්ෂයේ සියයට 87 ක වර්ධනයක් පෙන්නුම් කළ රන්දෙනිගල ජල විදුලි බලාගාරයේ විදුලිබල උත්පාදනය 1994 වර්ෂයේ තවදුරටත් සියයට 27 කින් වර්ධනය වී ගිගවොට් පැය 468 ක් විය. වික්ටෝරියා, කොත්මලේ සහ රන්ටැඹේ යන විදුලි බලාගාරයන්හි විදුලිබල උත්පාදනය පිළිවෙලින් සියයට 12 කින්, සියයට 14 කින් සහ සියයට 19 කින් වැඩි වී පිළිවෙලින් ගිගවොට් පැය 819 ක්, ගිගවොට් පැය 512 ක් සහ ගිගවොට් පැය 224 ක් විය. වික්ටෝරියා, කොත්මලේ ,රන්දෙනිගල සහ රන්ටැඹේ යන විදුලිබලාගාරයන් ආරම්භයේ සිටම මෙතෙක් වාර්තා කරණ ලද ඉහළම විදුලිබල උත්පාදනය මෙම වර්ෂයේදී වාර්තා කරණ ලදී. ඊට වෙනස්ව යමින් උකුවෙල විදුලි බලාගාරයේ උත්පාදනය සියයට 18 කින් අඩු වී ගිගවොට් පැය 146 ක් විය. මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන ජල විදුලි බලාගාර හයෙන් උත්පාදනය කරණ ලද මුළු විදුලිබල ප්‍රමාණය ජාතික විදුලිබල පද්ධතියේ සැපයුමෙන් සියයට 51 කට දයක විය. එය 1993 වර්ෂයේදී සියයට 48ක් ලෙස වාර්තා විය.

මහවැලි බල ප්‍රදේශය තුල 1993 වර්ෂයේ දී වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 22 කින් වැඩි වූ අතර, 1994 දී එය තවදුරටත් සියයට 14 කින් වැඩි වී හෙක්ටයාර 139,858 ක් විය. දෙකන්නයෙහිම වගා කරණ ලද මුළු බිම් ප්‍රමාණයෙහි වැඩිවීමක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයේ මහ කන්නය සමග සසඳන කල, 1993/94 මහ කන්නයේ වගා කරණ ලද මුළු බිම් ප්‍රමාණය සියයට 5 කින් වැඩි වී හෙක්ටයාර 78,658 ක් විය. මේ අතර, 1993 වර්ෂයේ සියයට 52 ක වර්ධනයක් පෙන් වූ යල කන්නයේ වගා කරණ ලද මුළු බිම් ප්‍රමාණය 1994 යල කන්නයේදී තවදුරටත් සියයට 27 කින් වර්ධනය වී හෙක්ටයාර 61,200 ක් විය. 1994 දී මහවැලි බල ප්‍රදේශය තුල වී වගා කරණ ලද මුළු බිම් ප්‍රමාණය සියයට 13 කින් වැඩි වී හෙක්ටයාර 116,010 ක් විය. පසුගිය වර්ෂයේ වෙනත් බෝග වර්ග වගා කරණ ලද බිම් ප්‍රමාණය සියයට 96 කින් වැඩි වූ අතර 1994 දී එය තවදුරටත් සියයට 15 කින් වැඩිවී හෙක්ටයාර 23,848 ක් විය.

මහවැලි වැඩපිළිවෙල යටතේ 1994 වර්ෂය තුලදී පදිංචි කරණ ලද මුළු පවුල් සංඛ්‍යාව 1,203 ක් වුවද, ඊට පෙර වසරේදී එය 4,973 ක් විය. 1976 වර්ෂයේ මහවැලි වැඩපිළිවෙල යටතේ ආරම්භ කරන ලද පවුල් පදිංචි කිරීම යටතේ මේ දක්වා වර්ෂයකට පදිංචි කරවන ලද අඩුම පවුල් සංඛ්‍යාව ලෙස මෙය වාර්තා වේ. පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාවෙන් "බී" කලාපයෙහි පවුල් 841 ක්ද, "සී" කලාපයෙහි පවුල් 332 ක් ද පදිංචි කරවන ලදී. 1994 අවසානය දක්වා මහවැලි වැඩපිළිවෙල යටතේ පදිංචි කරවන ලද සමුච්චිත පවුල් සංඛ්‍යාව 90,570 ක් විය.

## 1.36 සංඛ්‍යා සටහන

## මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | මහ 1990/91 | යල 1991 | එකතුව 1991 | මහ 1991/92 | යල 1992 | එකතුව 1992 | මහ 1992/93 | යල 1993 | එකතුව 1993 | මහ 1993/94 (අ) | යල 1994 (අ) | එකතුව 1994 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| "එච්" කලාපය | 31,385 | 19,806 | 51,191 | 31,931 | 4,312 | 36,243 | 33,390 | 11,660 | 45,050 | 33,481 | 22,996 | 56,477 |
| වී | 29,392 | 9,176 | 38568 | 29,294 | 1,262 | 30,556 | 29,117 | 2,291 | 31,408 | 29,950 | 11,205 | 41,155 |
| අනෙකුත් බෝග | 1,993 | 10,630 | 12,623 | 2,637 | 3,050 | 5,687 | 4,273 | 9,369 | 13,642 | 3,531 | 11,791 | 15,322 |
| "බී" කලාපය | 11,551 | 10,347 | 21,898 | 11,786 | 11,221 | 23,007 | 13,591 | 12,594 | 26,185 | 20,174 | 17,908 | 38,082 |
| වී | 10,912 | 9,837 | 20,749 | 11,175 | 10,624 | 21,799 | 12,513 | 11,956 | 24,469 | 18,321 | 16,007 | 34,328 |
| අනෙකුත් බෝග | 639 | 510 | 1,149 | 611 | 597 | 1,208 | 1,078 | 638 | 1,716 | 1,853 | 1,901 | 3,754 |
| "සී" කලාපය | 19,026 | 15,687 | 34,713 | 18,599 | 15,934 | 34,533 | 21,521 | 19,976 | 41,497 | 23,868 | 20,148 | 44,016 |
| වී | 15,632 | 15,008 | 30,640 | 16,760 | 15,098 | 31,858 | 19,289 | 19,089 | 38,378 | 20,256 | 19,427 | 39,683 |
| අනෙකුත් බෝග | 3,394 | 679 | 4,073 | 1,839 | 836 | 2,675 | 2,232 | 887 | 3,119 | 3,612 | 721 | 4,333 |
| "ජී" කලාපය | 5,063 | 4,668 | 9,731 | 5,180 | 174 | 5,354 | 5,414 | 3,732 | 9,146 | - | - | - |
| වී | 5,017 | 2,613 | 7,630 | 4,959 | 117 | 5,076 | 5,096 | 2,269 | 7,365 | - | - | - |
| අනෙකුත් බෝග | 46 | 2,055 | 2,101 | 221 | 57 | 278 | 318 | 1,463 | 1,781 | - | - | - |
| "එල්" කලාපය | 1,071 | 152 | 1,223 | 1,451 | 65 | 1,516 | 1,095 | 82 | 1,177 | 1,135 | 148 | 1,283 |
| වී | 700 | 84 | 784 | 824 | - | 824 | 684 | 42 | 726 | 705 | 139 | 844 |
| අනෙකුත් බෝග | 371 | 68 | 439 | 627 | 65 | 692 | 411 | 40 | 451 | 430 | 9 | 439 |
| එකතුව | 68,096 | 50,660 | 118,756 | 68,947 | 31,706 | 100,653 | 75,011 | 48,044 | 123,055 | 78,658 | 61,200 | 139,858 |

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

(අ) තාවකාලික.

### 1.37 සංඛ්‍යා සටහන

## මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් පදිංචි කිරීම ("එච්" "සී" "බී" "ජී" සහ "එල්" කලාපය)

පවුල් සංඛ්‍යාව

| කලාපය / වර්ෂය | "එච්" | "සී" | "බී" | "ජී" | "එල්" | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1976 | 2,383 | - | - | - | - | 2,383 |
| 1977 | 3,141 | - | - | - | - | 3,141 |
| 1978 | 2,754 | - | - | - | - | 2,754 |
| 1979 | 5,290 | - | - | - | - | 5,290 |
| 1980 | 7,407 | - | - | - | - | 7,407 |
| 1981 | 2,389 | 2,777 | - | - | - | 5,166 |
| 1982 | 1,449 | 2,683 | 1,918 | - | - | 6,050 |
| 1983 | 1,077 | 1,988 | 1,938 | 1,319 | - | 6,322 |
| 1984 | 1,956 | 1,992 | 1,381 | 446 | - | 5,775 |
| 1985 | 44 | 823 | 3,423 | 1,045 | - | 5,335 |
| 1986 | 780 | 2,151 | 1,260 | 583 | - | 4,774 |
| 1987 | 182 | 1,407 | 857 | 274 | - | 2,720 |
| 1988 | 14 | 1,081 | 656 | 85 | 3,270 | 5,106 |
| 1989 | 9 | 1,008 | 324 | 1,305 | 94 | 2,740 |
| 1990 | 1,680 | 3,427 | 3,492 | 366 | - | 8,965 |
| 1991 | 1,151 | 3,240 | 1,468 | 126 | - | 5,985 |
| 1992 | 754 | 2,005 | 1,716 | 6 | - | 4,481 |
| 1993 | 283 | 1,500 | 3,190 | - | - | 4,973 |
| 1994 (අ) | 30 | 332 | 841 | - | - | 1,203 |
| එකතුව | 32,773 | 26,414 | 22,464 | 5,555 | 3,364 | 90,570 |

(අ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## වෙනත් වාරිමාර්ග සංවර්ධනය

1994 වර්ෂයේ දී වෙනත් වාරිමාර්ග වැඩකටයුතු යටතේ කිරිදි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ II අදියර, මිනිපේ, නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය, වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රමය සහ ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සපයන ලද තාවකාලික දත්තයන්ට අනුව, ඉහත සඳහන් කළ ව්‍යාපෘති සඳහා 1993 වර්ෂයේ දී මුළු වියදම රුපියල් දශලක්ෂ 344 ක් වූ අතර, 1994 දී එය සියයට 25 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 430 ක් විය. ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුනක එනම්, කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය අදියර 1, ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය සහ නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමය අදියර II හි වැඩකටයුතු මෙම වර්ෂය තුළදී අවසන් කරන ලදී.

කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි දෙවන අදියර සඳහා 1994 වියදම් කරන ලද රුපියල් දශලක්ෂ 60 ත් සමඟ වර්ෂය අවසානය තෙක් කර තිබූ මුළු වියදම රුපියල් දශලක්ෂ 692 ක් විය.

වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ "නීල බැම්ම", "තුත්තනෝරිය" සහ "රදවි බැදි ඇල" යන වාරිමාර්ග ව්‍යාපෘතීන් හි වැඩ කටයුතු සඳහා රුපියල් දශලක්ෂ 22 ක් වැය විය.

## 1.38 සංඛ්‍යා සටහන
## තෝරා ගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම

| ව්‍යාපෘතිය | ආධාර ලබාගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශ ලක්ෂ) | | 1993 වියදම (රු. දශ ලක්ෂ) | 1994 වියදම (රු. දශ ලක්ෂ) | 1994 (අ) අවසානය දක්වා සමුච්චිත වියදම (රු.දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|---|
| 1. කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය - පියවර 11 | ඒ. ඩී. බී | එස්. ඩී. ආර් | 22.2 | 119.0 | 60.0 | 691.0 |
| 2. මිණිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | ජපානය | යෙන් | 1,295.0 | 63.0 | 190.0 | 416.0 |
| 3. වයඹ පලාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය | සී. ඊ. සී. | ඊ. සී. යූ | 6.3 | 21.5 | 22.8 | 122.8 |
| 4. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | අයි. ඩී. ඒ<br>ඊ. ඊ. සී. | රුපියල්<br>රුපියල් | 1,406.9<br>1,622.6 | 140.4 | 157.4 | 348.0 |

(අ) තාවකාලික.

මූලය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

මීට අමතරව ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 35 ක පුනරුත්ථාපන වැඩ කටයුතු වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 157 ක් වැය කර නිම කරන ලදී. දිස්ත්‍රික්ක 17 ක් තුළ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 174 ක් ක්‍රියාත්මක කරන ලදී.

ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ ක්‍රමය යටතේ, ගොවි සංවිධාන 9 ක් 1994 තුළදී අළුතින් ආරම්භ කළ අතර, වර්ෂය අවසානයේ දී මෙම සංවිධාන සංඛ්‍යාව 715 ක් විය.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල දිස්ත්‍රික් සංවර්ධන යෝජනා ක්‍රමයකි. මේ යටතේ දිස්ත්‍රික්කයන්හි යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා පුළුල් වශයෙන් ආයෝජනය කරණ ලදී. ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනයත්, ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කරගත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1994 දී සංවර්ධන වැඩසටහන් සියළු දිස්ත්‍රික්කයන්ට විමධ්‍යගත කිරීම සහ එම වැඩසටහන් අතර සැබෑ සම්බන්ධීකරණයක් ඇති කිරීම සිදු කරණ ලදී.

වර්තමානයේදී, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතේ දිස්ත්‍රික්ක 14 ක් තුල විවිධ යෝජනාක්‍රම 15 ක් ක්‍රියාත්මක වේ. යුරෝපීය ප්‍රජාවගේ කොමිසම (ඊ.ඊ.සී) මගින් ආධාර ලබන මොණරාගල වාරිමාර්ග සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන 1994 දී ආරම්භ විය. 1993 වර්ෂයේදී වැය වූ රුපියල් දශලක්ෂ 582 සමඟ සසඳන කල 1994 වර්ෂයේදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතේ වැය කල මුළු මුදල රුපියල් දශලක්ෂ 754 කි.

## 1.39 සංඛ්‍යා සටහන

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල - දිස්ත්‍රික්ක අනුව වියදම

රුපියල් දශලක්ෂ

| දිස්ත්‍රික්කය / ව්‍යාපෘතිය (ආ) | විදේශාධාර මූලාශ්‍රය | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | 1993 වර්ෂය අවසානය දක්වා (අ) | 1994 වර්ෂය අවසානය දක්වා (ඇ) | 1993 වර්ෂය තුළ දී (අ) | 1994 වර්ෂය තුළ දී (ඇ) |
| 1. මාතර (1979) | සීඩා (ස්වීඩනය) | 497 | 55 | 552 | 440 | 497 | 65 | 57 |
| 2. හම්බන්තොට (1979) | නෝරාඩ් (නෝර්වේ) | 1,330 | 50 | 1,380 | 833 | 894 | 65 | 61 |
| 3. නුවරඑළිය (1979) | නෙදර්ලන්තය | 578 | 14 | 592 | 480 | 524 | 33 | 44 |
| 4. බදුල්ල (1981) | කාෂි සං.ජා.අරමුදල සීඩා | 1,116 | 297 | 1,413 | 528 | 577 | 32 | 49 |
| 5. රත්නපුරය (1984) | නෙදර්ලන්තය | 352 | 19 | 370 | 282 | 309 | 40 | 27 |
| 6. මොණරාගල (1984) | නෝරාඩ් (නෝර්වේ) | 588 | 12 | 600 | 443 | 5,110 | 67 | 68 |
| 7. කෑගල්ල (1986) | කෘෂි. සං.ජා.අරමුදල | 408 | 228 | 636 | 400 | 494 | 79 | 94 |
| 8. කළුතර (1987) | ෆිනීඩා (පින්ලන්තය) | 397 | 70 | 467 | 405 | 415 | 34 | 10 |
| 9. මහනුවර (1987) | ජර්මනිය | 254 | 25 | 280 | 77 | 104 | 22 | 27 |
| 10. ගම්පහ (1989) | ජපානය | 786 | 98 | 884 | 77 | 104 | 22 | 27 |
| 11. එස්.පී.ආර්.ඩී.පී. (1991) (ඈ) | ආසියානු සංවර්ධන බැංකුව | 1,520 | 400 | 1,920 | 112 | 303 | 71 | 191 |
| 12. අනුරාධපුරය (1992) | සීඩා (ස්වීඩනය) | 146 | 16 | 162 | 30 | 65 | 21 | 21 |
| 13. ඒකාබද්ධ මූලික සේවා ව්‍යාපෘතිය පුත්තලම (1992) | යුනිසෙෆ් | 106 | 53 | 159 | 46 | 67 | 19 | 21 |
| 14. වියලි කලාපීය සහභාගිත්ව සංවර්ධන යෝජනා ක්‍රමය (1993) | කෘෂි. සං.ජා.අරමුදල /ජර්මනිය | 571 | 274 | 845 | 29 | 80 | 29 | 51 |
| 15. වාරිමාර්ග සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (1994) | යුරෝපීය ප්‍රජාවගෙ කොමිසම (ඉ) | 355 | 67 | 422 | 0 | 9 | 0 | 9 |
| එකතුව | | 9,003 | 1,678 | 10,682 | 4,649 | 5,403 | 582 | 754 |

(අ) සංශෝධිත.
(ආ) ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුළ දැක්වේ.
(ඇ) තාවකාලිකයි.
(ඈ) එස්. පී. ආර්. ඩී. පී. දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය.
(ඉ) සී. ඊ. සී. - යුරෝපීය ප්‍රජාවගේ කොමිසම.

මූලය : මුදල්, ක්‍රම සම්පාදන, ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.